ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD

ජාතික ලොතරැයිය

# 2018
# වාර්ෂික වාර්තාව
# ஆண்டு அறிக்கை
# ANNUAL REPORT

# පටුන

## 01. දළ විශ්ලේෂණය


| | |
|---|---|
| සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන් | 04 |
| නිෂ්පාදන විෂය ධාරාව | 14 |


## 02. විධායක වාර්තා


| | |
|---|---|
| සභාපතිනියගේ පණිවිඩය | 20 |
| ක්‍රියාකාරි අධ්‍යක්ෂගේ වාර්තාව | 23 |
| විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව | 25 |


## 03. මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 28 |
| ආදායම් ප්‍රකාශය | 55 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 55 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 56 |
| අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය | 57 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය | 58 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 59 |


## 04. මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය


| | |
|---|---|
| මූල්‍යමය ප්‍රමුඛතාවයන් | 86 |
| සමස්ත කාර්යසාධනය | 87 |
| නිෂ්පාදන කාර්යසාධනය | 88 |
| දස වසරක මෙහෙයුම් සමාලෝචනය | 92 |



# 01. දළ විශ්ලේෂණය



# සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන්

## සංස්ථාමය තොරතුරු

### ආයතනයේ නම

ජාතික ලොතරැයි මණ්ඩලය

### නෛතික තත්ත්වය

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි. 1997 වසරේදී ඉහත පනත යටතේ ඇති සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත සහ 1998 වසරේදී 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

### පිහිටුවන ලද වර්ෂය

1963

### ගිණුම් වර්ෂය අවසන් වනුයේ

දෙසැම්බර් 31

### ලියාපදිංචි කාර්යාලය

ලිපිනය: අංක 234/2, ගාලුපාර, කොළඹ 03.
දුරකථනය: 2470662, 2470663, 4607000
ෆැක්ස්: 2329576, 2421897, 2326528, 2433631,2470661
විද්‍යුත් තැපෑල : nlbgen@sltnet.lk
වෙබ් අඩවිය : www.nlb.lk

### විගණක

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

### බැංකුකරු

මහජන බැංකුව



# නියාමන ප්‍රතිපත්තීන්

## දර්ශනය

සමස්ත දිවයිනේ සමාජ, ආර්ථික, සංවර්ධනය උදෙසා සෑම ජන කොටසකගේම දායකත්වය තුළින් රාජ්‍ය ආයෝජන නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා.

## මෙහෙවර

සමාජ වගකීම් පෙරදැරිව, පාරිභෝගික විශ්වාසය දිනාගනිමින් ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිතා කරගනිමින්, නවතාවයෙන් යුතු ලොතරැයි හඳුන්වාදෙමින්, ආශ්චර්යමත් දේශයක් උදෙසා දක්ෂ කැපවූ කාර්ය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවූ අභිමානවත් ආයතනයක්.



## සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම



## මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩි දියුණු කිරීම
- පාරිභෝගික සංතුෂ්ටිය වැඩි කිරීම

# ප්‍රධාන සාරධර්ම

- වගකියන සහ වගකිව යුතු ආයතනයක්
- අවංක සහ විනිවිදභාවයෙන් යුතු ආයතනයක්
- කණ්ඩායම් පරිශ්‍රමය හා නිපුණත්වය පිළිබඳ විශ්වාසය
- නවීන තාක්ෂණය හා වෙනස් වීමට ඇති අභිරුචිය
- ඉහළම පාරිභෝගික සේවාවක් පිළිබඳ විශ්වාසය

# සභාපතිනිය සහ අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ
සුදත් ලොකුලියනගේ මහතා

ක්‍රියාකාරී අධ්‍යක්ෂ
තුසිත හල්ලොලුව මහතා

සභාපතිනිය
ශ්‍යාමිලා පෙරේරා මහත්මිය

නිරීක්ෂක/භාණ්ඩාගාර
නියෝජිත
ඒ. එම්. පී. එම්. බී.
අතපත්තු මහතා

අධ්‍යක්ෂ
චරිත එන්. විජේවර්ධන මහතා



# ජ්‍යෙෂ්ඨ කළමණාකරණය



එ . එච්. සුනිල් ගුණවර්ධන මහතා

B.A.Econ.(Colombo)

PG Dip.Econ.Dev(Colombo)
MA Econ. (Colombo) S.L.A.S (Class I)

සාමාන්‍යාධිකාරී

(09.03.2018 දින දක්වා)



කේ. ජී. කේ. විමලවීර මෙනෙවිය

Class One officer of Sri Lanka
Planning Service

Master of International Development,
(University Flinders, Australia.)

සාමාන්‍යාධිකාරී

(21.06.2018 දින සිට)



ප්‍රභාත් සන්ධ්‍ය තේජ මහතා
B.Sc. (Peradeniya)

අතිරේක සාමාන්‍යාධිකාරී



ආචාර්ය හර්ෂ බණ්ඩාර මහතා
DBA, MBA, FCMA(UK), FCCA (UK),
AMSLIM, FCMA(SL), FCPM, FCAA,CGMA.

ප්‍රධාන මූල්‍ය නිලධාරී



රෝහණ විජේවික්‍රම මහතා (FCA )

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(සාමූහික ව්‍යාපෘති මූල්‍ය)



එස්.ඒන්.ඒ. සුජීව නිශ්ශංක මහතා
D.Mgt.MBA (UK)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අලෙවිකරණ / ප්‍රවර්ධන)
(01.10.2018 දින සිට)



ගීතා පෙරේරා මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(මෙහෙයුම් මූල්‍ය)



ශ්‍යාමිණි බාලසූරිය මිය

Attorney – at- law, Notary public &
commissioner for oaths,

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)



කුමුදිනී මඩලුස්ස මිය

B.Com.Special (1st Class Hons Peradeniya)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

(ආදායම් මූල්‍ය) : (වැඩ බලන)

# ගමනෙහි ඉතිහාසය හා ප්‍රධාන පියවරයන්

## ගමනෙහි ඉතිහාසය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි. 1949 වසරේ එවකට පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබඳ අදහස රජයට ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹිණි.

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුළ ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි.

# ප්‍රධාන පියවරයන්

## පළමු දශකය 1963- 1972

1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කිරීම.

1964 ජාතික ලොතරැයි මණ්ඩලයේ පළමු දිනුම් ඇදීම - ටොරින්ටන් චතුරශ්‍රය. (1964/02/20)

1965 පළමුවරට බෙන්ස් මෝටර් රථයක් පිරිනැමීම.

1967 පළමු ශාඛා කාර්යාලය රත්නපුරයෙහි ආරම්භ කිරීම.

1968 ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දීම.

1970 ජාතික සම්පත ලොතරැයිය මහජන සම්පත ලෙසට පරිවර්තනය කිරීම. (1970/07/28)

## 1973- 1982 දෙවන දශකය

1975 සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත අංක 111/1 දරණ ස්ථානයට ප්‍රධාන කාර්යාලය රැගෙන යාම.

1977 ජාතික ලොතරැයියේ මිල ශත 50 - සිට රු. 1/- දක්වා වැඩි කිරීම.

## තුන්වන දශකය 1983- 1992

1987 සුපිරි ජාතික ලොතරැයිය හඳුන්වා දීම. (1987/04/11)

1988 මහජන සම්පත ලොතරැයියේ මිල රු. 1/- සිට රු. 8/- දක්වා වැඩි කිරීම.

ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම. (1988 සැප්තැම්බර්)

මහජන සම්පත ලොතරැයියේ ප්‍රථම රූපවාහිනි දිනුම් ඇදීම. (1988/05/10)

1989 මහජන සම්පත ලොතරැයියේ මිල රු. 8/- සිට රු. 10/- දක්වා වැඩි කිරීම.

1992 එයාර්පෝර්ට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ආරම්භ කිරීම.

## 1993-2002 හතරවන දශකය

1994 වාසනා සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.

1995 ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීම.

1996 සමෘද්ධි ලොතරැයිය ආරම්භ කිරීම.

1997 ශ්‍රම වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.

සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයිය මණ්ඩලය හා ඒකාබද්ධ කිරීම.

1999 සුපිරි වාසනා ලොතරැයිය ආරම්භ කිරීම.

2000 ජයවිරු ලොතරැයිය ආරම්භ කිරීම.

## පස්වන දශකය

## 2003-2012

2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට මූල්‍ය පහසුකම් සලසාදීම සඳහා සරණ ලොතරැයිය ආරම්භ කිරීම.

සේවක සුභසාධනය සඳහා සුභසාධන හා සකසුරුවම් අරමුදල ආරම්භ කිරීම.

2005 ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙන් (SLIM) සිදුකරන ලද ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී බැංකු හා මූල්‍ය සේවා අංශය යටතේ වඩාත් ජනප්‍රිය වෙළඳනාමය සඳහා වන සම්මානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිවීම.

2006 ලොටෝ ලොතරැයිය අහෝසි කොට සුවසෙත ලොතරැයිය ආරම්භ කිරීම.

ලොතරැයියක් සඳහා මෙතෙක් ගෙවන ලද ඉහළම සුපිරි ත්‍යාගය මහජන සම්පතෙන් පිරිනැමීම. (රු. මිලියන 61.3)

2007 නව ගුවන් තොටුපළ ලොතරැයිය ආරම්භ කිරීම.

එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිල ඩොලර් 25 සිට 50 දක්වා වැඩි කිරීම.

2008 දිනුම් අදින ලොතරැයිවල මිල රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම. (2008/09/02)

2010 ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි දෙකම අහෝසි කර ජාතික සම්පත ලොතරැයිය ආරම්භ කිරීම.

මහජන සම්පත ලොතරැයිය ඉරිදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

2011 ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. බිලියන 10 ක අලෙවි ඉලක්කය පසු කිරීම.බදාදා දිනුම් අදින ලද ජයවිරු ලොතරැයිය අහෝසි කර එදිනටත් සුපිරි වාසනා සම්පත ලොතරැයිය දිනුම් ඇදීම හඳුන්වා දීම.

නව ගුවන්තොටුපල ලොතරැයිය පැවැත්වීම.

සති තුනක් ඇතුළත රු. මිලියන 10 ට වඩා වැඩි සුපිරි ත්‍යාග 5 ක් පිරිනමන ලද අතර මින් 4 ක් එක දිගට දින 4 කදී සිදුවීම.

2012 සම්පත් රේඛා නමින් නව ලොතරැයියක් හඳුන්වා දීම.

ගොවිසෙත ලොතරැයිය බ්‍රහස්පතින්දා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

වාසනා සම්පත ලොතරැයිය සඳුදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම.

## 2013 – 2022

## වර්තමාන දශකය

2013 ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩි කිරීම.

සම්පත් රේඛා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කිරීම.

ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වන සංවත්සරය වෙනුවෙන් මෙගා 50 නැමති ලොතරැයිය ආරම්භ කිරීම.

2014 පවර් ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම.

2015 අලෙවි සහායකයින් සඳහා දිවිසරණ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම. (2015 ජූනි)

නීරෝගා ලොතරැයිය ආරම්භ කිරීම. (2015/07/25)

එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ 31 වෙනි දිනුම් ඇදීම. (2015/08/31)

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 03ක් පැවැත්වීම ආරම්භ කිරීම. (2015/09/01 සිට)
ප්‍රථම වරට මහත්මා අලෙවි නියෝජිත සම්මාන උළෙල පැවැත්වීම. (2015 දෙසැම්බර්)

2016 බිලියන 20 අලෙවි ඉලක්කය සපුරාලීම.

ඩොලර් ෆෝචූන් ලොතරැයිය ආරම්භ කිරීම. (2016/03/30)

පවර් ලොටෝ ලොතරැයිය අවලංගු කර මෙගා පවර් ලොතරැයිය හඳුන්වා දීම. (2016/05/11)

සුපිරි දෙලක්ෂපති ලොතරැයිය ආරම්භ කිරීම. (2016/05/27)

ජංගම දුරකථන කෙටි පණිවිඩ (එස්. එම්. එස්) මගින් ලොතරැයි අලෙවිය ආරම්භ කිරීම.

ගංවතුරෙන් විපතට පත් ජනතාව සඳහා මනුසත් මෙහෙවර නමින් ලොතරැයියක් ආරම්භ කිරීම.(2016/08/04)

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වොක්ෂෝල් වීදියෙහි පිහිටි ඉඩමෙහි මුල්ගල තැබීම. (2016/12/01)

ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ දෙවන ස්ථානය (රිදී සම්මානය) හිමිකර ගැනීම. (ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද.)

2017 මහජන සම්පත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම, බදාදා දින සහ සෙනසුරාදා දින හැර. (2017 මැයි මස සිට).

ගොවිසෙත ලොතරැයි දිනුම්වාර ගණන සතියට දින 05ක් කිරීම, සිකුරාදා සහ ඉරිදා හැර. (2017 ජූනි මස සිට)

සුපිරි ත්‍යාගය ලෙස නිවසක් පිරිනමන සෙවණ දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම.

ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගය 2017.10.26 දින සිට මිලියන 40 සිට මිලියන 60 දක්වා වැඩි කිරීම.

එක් දිනක් තුළදී දිනුම් අදින ලොතරැයි 04ක් පැවැත්වීම ආරම්භ කිරීම ඉරිදා දින හැර. (2017 ජූලි සිට)

ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා හා සම්මාන ප්‍රදානයේදී රාජ්‍ය ආයතන අංශය යටතේ කුසලතා සම්මානයක් හිමිකර ගැනීම.(ජාතික වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද.)

2017 සැප්තැම්බර් මස පැවැත්වූ සුමති ටෙලි සම්මාන උළෙලේ දී හොඳම ප්‍රචාරක දැන්වීම මහජන සම්පත ලොතරැයිය සඳහා දෙවන ස්ථානය හිමිකර ගැනීම.

2018 2018 ජනවාරි 01 මස සිට නිෂ්පාදන මිශ්‍රය වෙනස් වන ලදි.

ගොවිසෙත ලොතරැයිය සතියට දින 5ක් ලෙස පෙර පැවති දිනුම් ඇදීම වෙනුවට සතියේ දින 7 ම දිනුම් ඇදීම ආරම්භ කරන ලදි.

මෙගා පවර් ලොතරැයිය දිනුම් ඇදීම සතියට දින 02 සිට 03 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස ජාතික සම්පත ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කරන ලදි.

2018 ජනවාරි මස සිට නීරොගා ලොතරැයිය සුපිරි ත්‍යාගය රු.මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වඩි කරන ලදි

2018 අප්‍රේල් 2 දින ධන නිධානය ලොතරැයිය ආරම්භ කරන ලද අතර ආරම්භක දිනුම් ඇදීම 2018 මැයි මස 25 දින පවත්වන ලදි.

සම්පත් රේඛා හා දෙලක්ෂපති ලොතරැයි අහෝසි කරන ලදි.

2018 ඔක්තෝම්බර් මාසයේදී ජාතික ලොතරැයි මණ්ඩලය නො. 32, මුදලිගේ මාවත, කොටුව යන ස්ථානයේ පිහිටි නව ගොඩනැගිල්ල වෙත රැගෙන යන ලදි.

2018 ජනවාරි මස කලම්බු එයාර්පෝට් සුපඩ්‍රෝ දිනුම් ඇදීම පවත්වන ලදි.

# නිෂ්පාදන විෂයධාරාව

## දිනුම් අදින ලොතරැයි

### මහජන සම්පත




විස්තරය : ලොතරැයි වෙළඳපලෙහි පැරණිතම ලොතරැයිය වේ. ටිකට්පතෙහි මිල රු. 20/-කි.

දිනුම් අදින දින : සඳුදා, අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා සහ ඉරිදා

ත්‍යාග : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග

දායකත්වය : පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

### වාසනා සම්පත




විස්තරය : 1994 වසරේ වෙළඳපලට හඳුන්වා දෙන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/- කි.

දිනුම් අදින දින : බ්‍රහස්පතින්දා

ත්‍යාග : පහත සඳහන් පරිදි ප්‍රධන සුපිරි ත්‍යාග 03 ක් සහ රු.මිලියනයේ ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

ස්ටාර් සුපිරි ත්‍යාගය - රු. මිලියන 10 හෝ ඊට වැඩි

ෆෝචූන් සුපිරි ත්‍යාගය - රු. මිලියන 3 හෝ ඊට වැඩි

ලකී සුපිරි ත්‍යාගය - රු. මිලියන 2 හෝ ඊට වැඩි

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනුලැබේ.

### ගොවිසෙත



විස්තර : කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ගොවි භාරකාර අරමුදලට අරමුදල් උත්පාදනය සඳහා මණ්ඩලය විසින් මෙම ලොතරැයිය 1995 වසරේදී වෙළඳපලට හඳුන්වා දෙන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-

දිනුම් අදින දින : සඳුදා, අඟහරුවාදා. බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා

ත්‍යාග : රු. මිලියන 60 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු.මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය : පිරිවැටුමෙන් 10% කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවනු ලැබේ.

### සුපිරි වාසනා



විස්තරය : මෙම ලොතරැයිය 1999 වසරේදී හඳුන්වා දෙන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/- කි.

දිනුම් අදින දින : සඳුදා, සෙනසුරාදා

ත්‍යාග : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග.

දායකත්වය : සඳුදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% රණවිරු සේවා අධිකාරියට දෙනු ලබන අතර සෙනසුරාදා දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශවලට දෙනු ලැබේ.

## ජාතික සම්පත




විස්තරය : සුවසෙත හා ශ්‍රම වාසනා ලොතරැයි දෙකම වෙනුවට 2010 වසරේදී මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20/-.

දිනුම් අදින දින : බදාදා, සෙනසුරාදා

ත්‍යාග : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග. (මෙම ලොතරැයියේ අලෙවිය වැඩි කර ගැනීමේ පරමාර්ථයෙන් 2018 ජනවාරි මස සිට සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කරන ලදි.)

දායකත්වය : බදාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% සෞඛ්‍ය අමාත්‍යාංශයටද සෙනසුරාදා දින දිනුම් අදින ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% කම්කරු අමාත්‍යාංශයටද බෙදාදෙනු ලැබේ.

## සම්පත් රේඛා




විස්තරය : 2012 මාර්තු මස මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-. මෙම ලොතරැයිය 18.05.2018 දින අවලංගු කරන ලදි.

දිනුම් අදින දින : අඟහරුවාදා, සිකුරාදා, ඉරිදා

ත්‍යාග : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ

## නීරෝගා




විස්තරය : 2015 ජූලි මස 25 දින මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-.

දිනුම් අදින දින : අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, ඉරිදා

ත්‍යාග : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග. අලෙවි පිරිවැටුම අරමුණින් මෙම ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩි කරන ලද අතර 2018 ජනවාරි මස සිට මෙම ලොතරැයියේ ප්‍රථම ත්‍යාගය රු. 500,000 සිට රු. 1,000,000 දක්වා වැඩි කරන ලදි.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ජාතික වකුගඩු අරමුදලට බැර කරනු ලැබේ.

### මෙගා පවර්




විස්තරය : මෙම ලොතරැයිය 2016 මැයි මස 11 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-.

දිනුම් අදින දින : සඳුදා, බදාදා, සිකුරාදා

ත්‍යාග : පහත සඳහන් පරිදි ප්‍රධාන සුපිරි ත්‍යාග තුනකින් සහ රු. මිලියනයක ප්‍රථම ත්‍යාගයක් සහ සිත්ගන්නාසුළු ත්‍යාග.

මෙගා සුපිරි ත්‍යාගය - මිලියන 50 හෝ ඊට වැඩි

පවර් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි

ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය - මිලියන 10 හෝ ඊට වැඩි

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

### දෙලක්ෂපති ඩබල් ඩ්‍රීම්ස් (සුපිරි දෙලක්ෂපති)




විස්තරය : මෙම ලොතරැයිය 2016 මැයි මස 27 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-. මෙම ලොතරැයිය 21.05.2018 දින අහෝසි කරන ලදි.

දිනුම් අදින දින : සිකුරාදා

ත්‍යාග : සුපිරි ත්‍යාගය ලෙස රෙනෝල්ට් මෝටර් රථයක් සහ රු. 200,000 ත්‍යාග

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

### සෙවණ දිනුම් අදින




විස්තරය : මෙම ලොතරැයිය 2016 මැයි මස 27 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-.

දිනුම් අදින දින : අඟහරුවාදා, සෙනසුරාදා

ත්‍යාග : සුපිරි ත්‍යාගය සඳහා සුඛෝපභෝගී නිවසක් සහ රු. මිලියනයක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නාසුළු ත්‍යාග.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

### ධන නිධානය




විස්තරය : මෙම ලොතරැයිය 2018 අප්‍රේල් මස 02 දින ආරම්භ කරන ලදි. ටිකට්පතෙහි මිල රු. 20/-.

දිනුම් අදින දින : බදාදා, සිකුරාදා, ඉරිදා

ත්‍යාග : රු. මිලියන 80 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ



විස්තරය : සිවිල් ගුවන්සේවා අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 1992 වසරේ එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය හඳුන්වා දෙන ලදි. වර්තමානයේ එම ටිකට්පත ඇමෙරිකානු ඩොලර් 30කට හෝ ඊට සමාන පරිවර්තිත මුදල්වලට අලෙවි කරනු ලැබේ. දිනුම් ඇදීමට අදාළ නියමිත ටිකට්පත් ප්‍රමාණය (වර්තමානයේදී ටිකට්පත් 15000) විකිණී අවසන් වීමෙන් පසු දිනුම් ඇදීම සිදු කරනු ලැබේ. මෙම ලොතරැයියේ 32 වන දිනුම් ඇදීම 21.01.2018 දින පවත්වන ලදි.

ත්‍යාග : සුපිරි අතිසුඛෝපභෝගී (**Mercedes Benz**) මෝටර්රථයක් පිරිනමනු ලැබේ.

දායකත්වය : ශුද්ධ ආදායම සිවිල් ගුවන්සේවා අධිකාරියට යොමු කරනු ලැබේ.

## ඩොලර් ෆෝචූන්




විස්තරය : මෙම ලොතරැයිය 2016/03/30 දින හඳුන්වාදෙන ලදි. සෑම ටිකට්පතක්ම දැනට පවතින ඇමෙරිකානු ඩොලර් 10 ට හෝ ඊට සමාන පරිවර්තනය කළ හැකි ව්‍යවහාර මුදලට විකුණනු ලැබේ. ටිකට්පත් 30,000ක් විකිණී අවසන් වීමෙන් පසු දිනුම් ඇදීම පවත්වනු ලැබේ.

ත්‍යාග : ඇමෙරිකානු ඩොලර් 100,000

දායකත්වය : ශුද්ධ ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.

## ක්ෂණික ලොතරැයි

### සෙවණ ක්ෂණික




විස්තරය : නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදි. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි. සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර පසුව 1997 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කරන ලදි.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% නිවාස අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.

### සමෘද්ධි




විස්තරය : සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් 1996 වසරේදී මෙම ලොතරැයිය ආරම්භ කරන ලදි. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභීන් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% සමෘද්ධි හා තරුණ කටයුතු අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.



# 02. විධායක වාර්තා



# සභාපතිනියගේ පණිවිඩය



2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මම ඉතා සතුටු වෙමි.

2017 වර්ෂයේදී ලැබූ ආදායම් පසුබෑම නොතකා 2016 දී අත්කර ගත් බිලියන 20 ක ආදායමට වඩා වැඩි ආදායමක් අපේක්ෂාවෙන් 2018 වර්ෂය ප්‍රකාශයට පත්විය.

### මෙහෙයුම් සන්දිස්ථාන

2018 වර්ෂයේදී මණ්ඩලයේ සමස්ත කාර්යසාධනය ප්‍රශංසනීය බව ඉලක්ක සපුරා ගැනීම්වලින් පෙන්නුම් කෙරේ. කෙසේ නමුත්, ඔක්තෝම්බර් මස අග සිට දෙසැම්බර් මස මැද දක්වා වූ කාලය තුළ පැවති දේශපාලන අවිනිශ්චිතභාවය නොවේ නම් ආයතනයේ ප්‍රගතිය වඩාත් හොඳ වනු ඇත. එහෙත් අවසාන ප්‍රතිඵලය ගැන අපි සතුටු වෙමු. 2017 වර්ෂයේදී රු. මිලියන 16,747 ක් වූ පිරිවැටුම 2018 වන විට රු. මිලියන 20,438 ක් ලෙස වාර්තා වූයේ රු. මිලියන 3,691 ක පිරිවැටුමෙහි ඉහළ නැගීමක් පෙන්නුම් කරමිනි. මෙය පෙර වසරට වඩා 22% ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

1970 වර්ෂයේ සිට පැවත එන වඩාත් ජනප්‍රිය දිනුම් අදින ලොතරැයියක් වන මහජන සම්පත ලොතරැයිපත මගින් රු. මිලියන 5,587 ක ආදායමක් ලබාදී ඇති අතර ගොවිසෙත ලොතරැයි ආදායම මහජන සම්පත අභිබවා යමින් රු. මිලියන 6,634 ක් වූයේ සතියේ දින පහට සාපේක්ෂව සතියේ දින හතේම දිනුම් ඇදීම නිසාවෙනි. මෙම ලොතරැයිපත් දෙකෙහි ආදායම ඒකාබද්ධව ගත් කළ සමස්ත ආදායමෙන් 60%ක් විය. එමෙන්ම මෙගා පවර් ලොතරැයි ආදායම රු. මිලියන 2,181 ක් වූ අතර, ජාතික සම්පත ලොතරැයිය රු. මිලියන1.053 ක ආදායමක් උපයා දෙන ලදි. මෙම ලොතරැයිපත් හතර සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 1,000කට ඉහළ ආදායමක් ඉපැයීම සඳහා දායක වී ඇත.

මණ්ඩලය විසින් 2018 වසරේදී සුපිරි ත්‍යාගලාභීන් 38 දෙනෙකු බිහි කළ අතර එයට සාපේක්ෂව පෙර වසරේ 44ක් විය. 2018 වර්ෂයේදී විකුණුම් මත ඒකාබද්ධ අරමුදල සඳහා මණ්ඩලයේ දායකත්වය රු. මිලියන 2,426ක් වූ අතර එය 2017 වර්ෂයේ රු. මිලියන 2,016 ට සාපේක්ෂව රු. මිලියන 410ක ඉහළ යාමකි. පවත්නා වර්ෂයේදී බදු ඇතුළුව රජයට ලබාදුන් මුළු දායකත්වය රු. මිලියන 5,139.2 ක් වූ අතර එය විකුණුම්වලින් 25% කට වඩා වැඩි විය. පසුගිය වර්ෂයේදී රජයට ලබාදුන් මුළු දායකත්වය රු. මිලියන 3,949.2 කි.

මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයින් සඳහා ලබාදෙන ලද නියෝජිත කොමිස් මුදල 2017 වර්ෂයේ රු. මිලියන 3,102.9 ක් වූ අතර එයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී එය රු. මිලියන 3,826.2 ක් එනම් එය රු. මිලියන 723.3ක විශිෂ්ඨ ඉහළ නැගීමකි. විකුණුම් වැඩි වීමේ ප්‍රතිලාභය බෙදාහරින්නන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා වෙළඳ නියෝජිත ජාලයට ලබාදෙන බවට මෙය පැහැදිලි ඇඟවීමකි. 2017 වසරේ රු. මිලියන 7,994.80 වූ මණ්ඩලයේ ත්‍යාග ගෙවීම් හා සසඳන විට 2018 වසරේ දී එය රු. මිලියන 9,834.7 ක් එනම් රු. මිලියන 1,840 කින් වැඩි වී ඇති අතර එමගින් අපගේ පාරිභෝගිකයින්ගේ විශ්වාසනීය මට්ටම නිසැකව ඉහළ ගොස් ඇතැයි අප සිතන්නෙමු. මෙය 23% ක වැඩි වීමකි.

2017 වර්ෂයේ මණ්ඩලයේ අනෙකුත් ආදායම රු. මිලියන 387.7 ක් වූ අතර එයට සාපේක්ෂව 2018 වර්ෂයේදී එය 414.3ක් විය. වර්ෂය අග භාගයේදී පොළී අනුපාත ඉහළ යාම මෙම වැඩි වීමට හේතු විය. 2017 වසරේ රු. මිලියන 1,833.5 වූ මෙහෙයුම් වියදම් එම වසරේ එය විකුණුම් මත 11% ගත් අතර ඒ හා සසඳන විට 2018 වසරේ මෙහෙයුම් වියදම් රු. මිලියන 2,043 ක් එනම් විකුණුම් මත 10% ක ප්‍රතිශතයකි. විකුණුම් මත ප්‍රතිශතයක් ලෙස මෙය අඩුවීමක් පෙන්නුම් කරයි.

2017 වසරේ බදු පෙර ශුද්ධ අතිරික්තය වූ රු. මිලියන 624.4 ක් එනම් විකුණුම් මත 4% ප්‍රතිශතයක් වාර්තා කළ අතර ඒ හා සසඳන විට 2018 වසරේදී රු. මිලියන 1,038.1 ක් එනම් විකුණුම් මත 5% ප්‍රතිශතයක් වාර්තා කර ඇත. සත්‍ය වශයෙන් ම මෙම වැඩිවීම රු. මිලියන 413.7 කි. 2018 වර්ෂයේ මණ්ඩලයේ අවසාන ප්‍රතිඵලය වූයේ රු. මිලියන 136.2 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ හිඟයකි. මෙයට හේතු වූයේ රු. මිලියන 1,174.4 ක ආදායම් බදු සංරචකයයි. ඒකාබද්ධ අරමුදල් ගෙවීම් සඳහා දායකත්වය පෙන්වීමට ඉඩ ලබා නොදීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ ආදායම් බද්දක් ඇති විය. 2017 වර්ෂයේදී මෙම ගෙවීම් අඩු කළ හැකි වියදමක් ලෙස ඉඩ ලබා දී තිබූ බැවින් රු. මිලියන 139.8 ක බදු ගෙවීමෙන් පසු ශුද්ධ අතිරික්තයක් පැවතුනි.

2018 ජනවාරි 1 දින සිට නිෂ්පාදන මිශ්‍රය වෙනස් කරන ලදි. මෙම වෙනස් වීමත් සමඟ ගොවිසෙත ලොතරැයිපත පෙර පැවති සතියේ දින 5ක දිනුම් ඇදීම දින 7 ක් දක්වා වෙනස් විය. මෙගා පවර් දිනුම් ඇදීම සතියේ දින 2 සිට 3 ක් දක්වා

වැඩි කරන ලදි. 2018 ජනවාරි මස සිට ජාතික සම්පත හා නීරෝගා සුපිරි ත්‍යාග රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා ඉහළ දමන ලදි. තවද, 2018 ජනවාරි මස සිට ප්‍රසාද දීමනාවක් ලෙස රු. 100,000 ක අතිරේක ත්‍යාග කාණ්ඩයක් නීරෝගා ලොතරැයියෙන් හඳුන්වා දෙන ලදි. ධන නිධානය නමින් නව ලොතරැයියක් අප්‍රේල් 2 වන දින දියත් කරන ලද අතර 2018 මැයි මස 25 වන දින එහි පළමු දිනුම් ඇදීම පැවැත්විණි. නිෂ්පාදන මිශ්‍රයේ සිදු වූ වෙනස්කම් සහ නව ලොතරැයි එළිදැක්වීමත් සමඟ සම්පත් රේඛා සහ දෙලක්ෂපති ලොතරැයිපත් නවතා දමන ලදි. ධන නිධානය ලොතරැයිපත එළි දැක්වීමත් සමඟ කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී අලෙවි නියෝජිතයින් සඳහා අභිප්‍රේරණ වැඩසටහනක් ද පැවැත්විණි. 2018 මාර්තු මස සිට රූපවාහිනී දිනුම් ඇදීම් මැදිරිය මැදිරි අංක 03 සිට මැදිරි අංක 02 (පෙර ප්‍රවෘත්ති මැදිරිය)ලෙස වෙනස් කරන ලදි. 2018 මාර්තු මාසයේදී ජාතික ලොතරැයි මණ්ඩලය නව වෙබ් අඩවියක් දියත් කළේය.

මෙම වසරේදී ජාතික ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි සහායකයින් හට ලබාදෙන දිරි දීමනා බැර කරන ලද බැංකු පොත් බෙදා හැරීම ආරම්භ කරන ලදි. කොළඹ දිස්ත්‍රික්කයේ අලෙවි සහායකයින් සඳහා මෙම බැංකු පොත් ලබාදීමේ මූලික උත්සවය 2018 මාර්තු 30 වන දින කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණි.

රූපවාහිනී සංස්ථාව විසින් සිංහල හා දෙමළ අළුත් අවුරුදු සමයේ අප්‍රේල් මාසයේ මහියංගනය ප්‍රදේශයේ සංවිධානය කරන ලද ජාතික අවුරුදු උළෙල සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සහභාගී විය. මෙම අවස්ථාවේ අපගේ වෙළඳ කුටි තුළ පැවති විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වූ පුද්ගලයන් දැක්වූ සතුට මගින් එහි සාර්ථකත්වය තහවුරු විය. සිටි එෆ්. එම්. (City FM) නාලිකාව ඔස්සේ 2018 ජූලි මස සිට සෑම ඉරිදාවකම උදෑසන 8 සිට රාත්‍රී 9 දක්වා NLB ප්‍රාර්ථනා නමින් විකාශනය වීමට සතිපතා සංගීත වැඩසටහනක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ආරම්භ කරන ලදි.

මාර්තු මස 6 සිට 8 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල සිංහල හා මුස්ලිම් ජනතාව අතර ඇතිවූ නොසන්සුන්තාවයක් හේතුවෙන් පැවති ඇඳිරි නීතිය එම දිස්ත්‍රික්කයේ විකුණුම් සඳහා විශාල බලපෑමක් එල්ල වීමත් සමඟ මාර්තු මස 7 වන දින කිසිදු විකුණුම් ප්‍රමාණයක් වාර්තා නොවීය. තවද මැයි මාසයේ දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක 150,000 ක් පමණ ජනතාවකට බලපෑ අධික වර්ෂාව හේතුවෙන් ද විකුණුම් තව දුරටත් අඩු විය.

2018 ඔක්තෝබර් මස සිට ජාතික ලොතරැයි මණ්ඩලය අංක 32, මුදලිගේ මාවත, කොටුව යන ලිපිනයෙහි නව ගොඩනැගිල්ලකට ගෙන යන ලදි. එම නිසා වසර 20 ක් පමණ කොල්ලුපිටිය ප්‍රධාන කාර්යාලයෙහි සහ ගෝල්ෆේස් හි ශාඛාවෙහි සේවය කරන ලද සේවකයින් නව ගොඩනැගිල්ලට මාරු වන ලදි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙතෙක් රැඳී සිටි ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගැටළුවලට අමතරව කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් ලබාදීම සහ ඉඩ පහසුකම් බාධාවන් වලක්වා ගනිමින් ඵලදායී වැඩ පරිසරයක් ඇති කිරීමයි.

නව ගොඩනැගිල්ල කුලී පදනම මත පවතින අතරතුර මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් අත්හිටුවා ඇති නව ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අවසර ලද පසු ඉදිරියට ගෙන යාමට අපි බලාපොරොත්තු වෙමු.

**එළඹෙන වසර**

2019 වර්ෂයේ මණ්ඩලයේ අයවැය ගත විකුණුම් ආදායම රු. මිලියන 21,000 කි. විකුණුම් නියෝජිතයන් සහ අලෙවිකරුවන් සඳහා දිරි දීමනා ලබා දීම, පවත්නා වෙළඳපොල පුළුල් කිරීම, වෘන් අලෙවිය, රටේ විශේෂ සිදුවීම් සහ වැදගත් උත්සව ආවරණය කිරීම, අදාළ ලෙස නව නාලිකා ආරම්භ කිරීම (සුපිරි වෙළඳපොල සහ ආයතන) සහ නව කවුන්ටර් සැපයීම යනාදී උපාය මාර්ග කෙරෙහි මණ්ඩලය විසින් අවධානය යොමු කර ඇත.

විද්‍යුත් රාජ්‍ය ප්‍රතිපත්තියට (E Government policy) අනුකූලව පවත්නා ලොතරැයිවල කෙටි පණිවිඩ හරහා ලොතරැයි අලෙවිය වඩා ශක්තිමත් කිරීමටත් නව විද්‍යුත් ක්‍රමවේද හරහා නව ලොතරැයි ආරම්භ කිරීම පිළිබඳව සොයා බැලීමටත් මණ්ඩලය සැලසුම් කර ඇත. දිනුම් අදින ලොතරැයි සහ සූරන ලොතරැයිපත් වසර කිහිපයකින් පරිපූර්ණ ස්ථානයකට ළඟා විය හැකි අතර අනාගතයේදී නව මාධ්‍යන් ප්‍රකාශනයට අත්‍යාවශ්‍ය බව සඳහන් කළ යුතුය.

අවශ්‍ය ඕනෑම ස්ථානයකට වඩාත් ඵලදායී සේවා පහසුකම් සැපයීම සඳහා අලෙවි නියෝජිත ජාලය අඛණ්ඩව සමාලෝචනය කරමින් නියෝජිතයින් නොමැති ප්‍රදේශ සහ අඩු කාර්යසාධනයක් සහිත නියෝජිතයන් වෙනුවෙන් නව නියෝජිතයින් පත් කරනු ලැබේ. මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණ සහිතව අලෙවි නියෝජිතයින් මුහුණ දුන් ගැටළුවලට විසඳුම් ලබාදීම සඳහා මණ්ඩලය විසින් තෝරාගත් දිස්ත්‍රික්ක තුළ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නියෝජිත රැස්වීම් අඛණ්ඩව පවත්වනු ඇත.

පවත්නා මොඩියුලයන් සඳහා නව අංග එකතු කිරීමෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා

ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය (ERP) වැඩිදියුණු කිරීමට අපි සැලසුම් කරන්නෙමු.

ඉතා වටිනා මඟපෙන්වීම් සහ උපදෙස් ලබාදීම පිළිබඳව ගරු මුදල් අමාත්‍යවරයාට සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාටද වර්ෂය තුළ විශිෂ්ඨ සහයෝගයක් ලබා දුන් මුදල් අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීන් හට ද මාගේ අවංක ස්තූතිය පුද කර සිටිමි.

**සමාප්තිය**

තවද ලබාදුන් සහයෝගය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට, ඉතා වගකීමෙන් යුතුව කටයුතු කිරීම සහ උපරිම සහයෝගය ලබාදීම වෙනුවෙන් සමස්ත කාර්ය මණ්ඩලයට, ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අධිෂ්ඨානශීලීව කටයුතු කිරීම වෙනුවෙන් සියලුම දිස්ත්‍රික් අලෙවි නියෝජිතවරුන්ට, අලෙවි නියෝජිතවරුන්ට හා විකුණුම්කරුවන් හට ද විශේෂයෙන්ම අපගේ ලොතරැයි පරාසය පිළිබඳව අඛණ්ඩ විශ්වාසය තැබූ පාරිභෝගිකයින් හට ද මාගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. ලොතරැයි මුද්‍රණකරුවන් සහ අපගේ ප්‍රධාන බැංකුව වන මහජන බැංකුව සහ අනෙකුත් බැංකු ලබාදුන් වටිනා සේවාවන් සඳහා මම ස්තූතිවන්ත වෙමි.

අවසාන වශයෙන් 2019 වර්ෂය සඳහා වඩාත් හොඳ සමාප්තියක් වෙනුවෙන් මෙම ගම්‍යතාවය අඛණ්ඩව පවතිනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.



**ශ්‍යාමිලා පෙරේරා**
**සභාපතිනි,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**2019 මාර්තු 26.**
**කොළඹ.**

# ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ වාර්තාව



2018 වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්-ඩලය සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමු.

### ප්‍රධාන ක්‍රියාකාරකම්

අප හා බැඳුණු සියළු පාර්ශවයන්ට සමෘද්ධිය සලසමින් ලොතරැයි වෙළඳපල තුළ සියළු වෙළඳපල ඛණ්ඩයන් කරා හරවත් උපායමාර්ගයන්ගෙන් යුතුව අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවතින ලොතරැයි වර්ග රාශියකින් සමන්විත නිෂ්පාදන විෂය ධාරාවකින් ජාතික ලොතරැයි මණ්ඩලය සමන්විත වේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ දිනුම් අදින හා ක්ෂණික ලොතරැයි පවත්වාගෙන යාමයි. සමාලෝචිත වසරේදී මෙම ක්‍රියාකාරකම් ස්වභාවයේ කිසිදු වෙනසක් සිදු නොවිණි.

### අඛණ්ඩ පැවැත්ම

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් පැවතීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

### මෙහෙයුම් සමාලෝචනය හා අනාගත අපේක්ෂා

සමාලෝචිත වසර තුළ මණ්ඩලීය කටයුතු සහ එහි කාර්යසාධනය සමඟ මූල්‍ය ප්‍රතිඵල සභාපතිතුමියගේ පණිවිඩයේ අඩංගු අතර එක් එක් ලොතරැයිවල කාර්යසාධනය මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනයෙහි අඩංගු වේ.
ව්‍යාපාරික කටයුතු සම්බන්ධ උපායමාර්ගයන් තවදුරටත් වෙළඳපලට හඳුන්වා දීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ. මෙය ඉටු කර ගැනීම සඳහා පවතින ලොතරැයි වෙළඳපලෙහි කාර්යසාධනය තවදුරටත් වැඩි කර ගැනීම සහ නිෂ්පාදන විවිධාංගීකරණය පිළිබඳ සැලකිල්ල යොමු කරමින් වෙබ් සහ ඊ ලොතරැයි වෙළඳපලට හඳුන්වා දීම සඳහා පවතින ඉඩ ප්‍රස්ථා පිළිබඳ අවධානය යොමු කිරීමට අපේක්ෂිතය.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට මණ්ඩලය විසින් සියළුම සේවක ගෙවීම් සහ රජයට කරන ලද ගෙවීම් නියමිත දිනට ගෙවූ බවට මණ්ඩලය සෑහීමකට පත්වේ.

### පාරිභෝගික සංතෘප්තිය

හැකි සෑම අවස්ථාවකම කාලය ශ්‍රමය වැය කර පාරිභෝගික අවශ්‍යතාවය හඳුනාගෙන ඉන්පසු ඔවුනට හොඳ මිලකට ඉල්ලුමට සරිලන පරිදි ලොතරැයි ලබාදෙමින් සම්බන්ධතාවය හා විශ්වාසවන්ත බව ගොඩනගාගැනීම වටිනා බව මණ්ඩලය තරයේ විශ්වාස කරයි.

මෙම කරුණ පිළිබඳ සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන විෂයධාරාව තුළ පාරිභෝගික ආකල්ප සම්පූර්ණ වන පරිදි සංශෝධන සිදු කරන ලදි. ඒ අනුව සුවිශේෂී සමාජ මෙහෙවරක අවශ්‍යතාවය සපුරාලන්නට දායක වෙමින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් ජනනය කිරීම සඳහා අපගේ නවතම ලොතරැයිය වන ධන නිධානය ලොතරැයිය වෙළඳපලට හඳුන්වා දෙන ලදි.

### මානව සම්පත් සංවර්ධනය

සේවක මඬුල්ලේ ශක්තිය හා හැකියාවන් සීඝ්‍රයෙන් වෙනස්වෙමින් පැවතීම සැබෑ දියුණුවට අවස්ථා සලසන බව මණ්ඩලය තරයේ විශ්වාස කරයි. අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගැනීම උදෙසා කාර්යක්ෂම හා අභිප්‍රේරිත කණ්ඩායමක් උදෙසා අවශ්‍ය සියලුම ක්‍රියාදාමයන් හා පරිශ්‍රමයන් ගෙන ඇත.

සේවකයින් බඳවා ගැනීම්වලට සංවර්ධනයට හා රඳවා තබාගැනීමට හා ආයතනයේ සාමූහික පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා ඔවුනගේ ප්‍රශස්ත දායකත්වය ලබාගැනීමට අවශ්‍ය යෝග්‍ය මානව සම්පත් ප්‍රතිපත්තීන්

හා ක්‍රියාදාමයන් මණ්ඩලය සතුව පවතී.

සේවක අභිප්‍රේරණය හා ඵලදායීතාවය ඉහළ දැමීම සඳහා විකුණුම් දිරි දීමනා ක්‍රමය ක්‍රියාත්මක විය. සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය සියළුම සේවකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් ආවරණය වන පරිදි ලබාදෙන ලදි. තවද ප්‍රවාහන පහසුකම් නොලබන සියළුම සේවකයින් සඳහා ප්‍රවාහන දීමනාවක් ලබාදීම, නිල ඇඳුම් දීමනාවක් ලබාදීම අඛණ්ඩව ක්‍රියාත්මක විය.

සේවකයින්ගේ කුසලතා හා දැනුම වර්ධනය කිරීම සඳහා නව සේවක පුහුණු කිරීම් ක්‍රමයක් යටතේ මූල්‍ය පහසුකම් ලබාදෙන ලදි.

### රජයට කරන ලද දායකත්වය

2017 වසරේදී ගෙවන ලද රු. මිලියන 3,949.2 ට සාපේක්ෂව ඒකාබද්ධ අරමුදලට කළ සෘජු ප්‍රතිපාදන හා බදු මගින් කරන ලද වක්‍ර ප්‍රතිපාදන ලෙස 2018 වසරේ රු. මිලියන 5,139.2 ක් මණ්ඩලය විසින් රජයට ලබාදෙන ලදි, ප්‍රතිශතයක් ලෙස ගත් විට 30.1% වැඩි වීමක් පෙන්නුම් කරයි.

### දේපල යන්ත්‍ර හා උපකරණ

2017 වසරේ වැය කරන ලද රු. මිලියන 39.1ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය රු. මිලියන 67.4 ක මුදලක් දේපල යන්ත්‍ර හා උපකරණවල ආයෝජනය කරන ලදි.

### වියදම්

සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 2,043 ක් වූ මුළු වියදම් පෙර වර්ෂයේ රු. මිලියන1,833.5 සමඟ සසඳන විට 11.4% ක වැඩි වීමක් පෙන්වන අතර එය මුළු පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට පසුගිය වසරේ 11% ක් වූ අතර මෙම වසරේ 10% කි. මෙලෙස ප්‍රතිශතයක් ලෙස වියදම් අඩුවීම වඩා හිතකර ප්‍රතිඵලයක් අත්කර දීමට සමත් විය.

### සමාප්තිය

ඉතා ඉහළ ප්‍රතිඵලයක් අත්පත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කළමණාකාරීත්වය හා සියළුම සේවක මඩුල්ල ලබාදුන් කැපවීමෙන් යුතු සේවයට සහ ඵලදායී කාර්යසාධනය වෙනුවෙන් සියළු දෙනාටම ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.

දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්, සාමාන්‍ය අලෙවි නියෝජිතයින්, බැංකුකරුවන්, සැපයුම්කරුවන්, මුද්‍රණකරුවන්, විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලය සහ ලොතරැයි විගණකවරු ආදී අප හා බැඳුණු සියළුම පාර්ශවකරුවන්ට ඔවුනගේ විශ්වාසනීය සේවයට හා කැපවීමට ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.

අපගේ පාරිභෝගික ජනතාව විශ්වාසනීය ලොතරැයි ආයතනය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය කෙරේ තැබූ විශ්වාසය හා ලෙන්ගතු බව අමතක නොකරන අතර ඔවුන් සඳහා විශේෂ ස්තූතිය පුදකරමි.

**තුසිත හල්ලොලුව,**
**ක්‍රියාකාරී අධ්‍යක්ෂ,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**2019 මාර්තු 26 දින,**
**කොළඹ.**

# විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව

### දළ විශ්ලේෂණය

විගණන හා කළමණාකරණ කමිටුව 2005 වසරේ ස්ථාපිත කරන ලද අතර එතැන් සිට සෑම වසරකම යොදාගත් පරිදි රැස්වීම් වාර පවත් වන ලදී. 2018 වසරේ රැස්වීම් වාර 04 ක් පවත් වන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණත්වය, අවදානම් කළමණාකරණය, අභ්‍යන්තර පාලනය, නීති රීති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම, බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය, සුදුසුකම්, ස්වාධීනත්වය හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය යනාදිය සම්බන්ධ කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දැක්වීම විගණන හා කළමණාකරණ කමිටුවේ නිර්දේශය හා නියාමනය වේ.

අදාළ අධිකාරීන් විසින් අනුමත කරන ලද නිර්දේශ හා නියාමනයන්ට අනුකූලව කමිටුව ක්‍රියාත්මක කරන අතර පහත සඳහන් සාමාජිකයින්ගෙන් කමිටුව සමන්විත වේ.

ඒ. එම්. පී. එම්. බී. අතපත්තු මහතා - සභාපති (නිරීක්ෂක / භාණ්ඩාගාර නියෝජිත )

චරිත එන්. විජේවර්ධන මහතා - සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)

සුදත් ලොකුලියනගේ මහතා - සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ)

### නිරීක්ෂකයින්

අභ්‍යන්තර විගණක - තනූජා සම්මානි මිය

නියෝජිත - විගණකාධිපති දෙපාර්තමේන්තුව

එස්. බාලසූරිය මිය - (නි. සාමාන්‍යාධිකාරී නීති / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

කළමණාකරණයේ අනිකුත් සාමාජිකයින් පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවලදී රැස්වීම්වලට කැඳවයි.

### වගකීම් හා කාර්යභාරය

මණ්ඩලයේ මූල්‍ය තොරතුරු විමර්ශනය කිරීම පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සකස් කරන ලද වාර්ෂික වාර්තා, සංයුක්ත සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් සහ කාර්තුගත වාර්තා තුළින් මූල්‍ය ප්‍රකාශනවල පරිපූර්ණත්වය පිළිබඳ අධීක්ෂණය කිරීම.

අභ්‍යන්තර විගණන කටයුතුවල කාර්යසාධනය නිරීක්ෂණය කිරීම හා ස්වාධීනත්වය තක්සේරු කිරීම.

බාහිර විගණන වාර්තා විමර්ශනය කිරීම.

අභ්‍යන්තර පාලනය විමර්ශනය කිරීම.

සමාලෝචිත වසර තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

### මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශයන් හා වාර්ෂික වාර්තා කමිටුව විසින් සැලකිල්ලට භාජනය කරන ලදි. යොදාගන්නා ලද ගිණුම්කරණ කටයුතු පිළිබඳ කමිටුව සෑහීමකට පත්වේ.

### අභ්‍යන්තර විගණන කටයුතු

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන ලද්දේ අභ්‍යන්තර විගණක විසිනි. අභ්‍යන්තර විගණක විසින් විගණන වාර්තා ඉදිරිපත් කරන ලද අතර එම අභ්‍යන්තර විගණන වාර්තා සෑම අවස්ථාවකම විගණන හා කළමණාකරණ කමිටුව විසින් විමර්ශනය කරනු ලැබේ.

අභ්‍යන්තර විගණනයේ කාර්යසාධනය පිළිබඳ විධිමත් තක්සේරුවක් කමිටුව විසින් සිදුකරන ලද අතර එම කටයුතුවල කාර්යසාධනය පිළිබඳ සෑහීමකට පත් වේ.

### විගණන කමිටුවේ නියාමන අනුකූලතාවය

අවශ්‍ය නීති සම්පාදනය හා යහපත් පරිචයන් සැලකිල්ලට ගනිමින් විගණන කමිටුවේ කාර්යසාධනය හා නියමයන් වාර්ෂිකව කමිටුව විසින් විමර්ශනය කරනු ලැබේ.

## අනුකූලතාව

පිළිගත් ප්‍රතිපත්තීන්වලට අනුකූලව මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු මෙහෙය වූ බවට මණ්ඩලයේ මෙහෙයුම් පාලනයන් හා ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සාධාරණ සහතිකයක් සපයන බව විගණන කමිටුව පිළිගන්නා අතර කමිටුව ඒ පිළිබඳ සෑහීමකට පත් වේ.



**ඒ. එම්. පී. එම්. බී. අතපත්තු,**
**සභාපති,**
**විගණන හා කළමණාකරණ කමිටුව,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**26 මාර්තු 2019,**
**කොළඹ.**

# 03. මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු



# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No.
පීයූආර්/ජී/එන්එල්බී/1/18/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2019 ඔක්තෝබර් 22 දින

සභාපති

ජාතික ලොතරැයි මණ්ඩලය

**ජාතික ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ලොතරැයි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර)**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**1.2.1.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති**

(අ) **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09**

ප්‍රමිතයේ 4.1.1 ඡේදයට අනුකූල නොවන ලෙස මණ්ඩලයේ මූල්‍ය වත්කම් වර්ගීකරණය කර තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 13**

ප්‍රමිතයේ 91 ඡේදයට අනුකූලවන පරිදි සාධාරණ අගය මැනීම පිළිබඳ මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15**

ප්‍රමිතයේ 110 ඡේදයේ අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මණ්ඩලය විසින් පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**1.2.1.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

(අ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01**

(i) මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් අංක 1.4 හා 2.1.2 ඡේදය මඟින් වාර්තා කර තිබුණද සටහන් අංක 2.7 මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 සහ 15 අනුගමනය නොකළ බව වාර්තා කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබූ මහජන ඇමතුම් පද්ධතිය නියමිත දිනට ආයතනයට නොසැපයීම් මත අයකරගෙන තිබූ රු.488,800 ක මුදල වෙනත් ආදායම් ලෙස නොසලකා උක්ත ප්‍රමිතියේ 32 ඡේදයට පටහැනිව මහජන ඇමතුම් පද්ධතියේ පිරිවැයෙන් අඩුකර දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 69 ඡේදයට පටහැනි ලෙස පෙර වර්ෂවලදී ජංගම වගකීම් ලෙස හඳුනා ගෙන තිබුණු රු.9,063,436 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේදී වෙනත් අදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගතකර තිබුණි. මෙම ක්‍රමවේදය මණ්ඩලය විසින් පෙර වර්ෂවල සිටම දිගින් දිගටම අනුගමනය කරන බව නිරීක්ෂණය විය.

(iv) ප්‍රමිතයේ 69 වන වගන්තියට පටහැනි ලෙස පෙර වර්ෂවලදී ජංගම වගකීම් ලෙස ඇස්තමේන්තුගත කර තිබූ රු.16,141,331 මුදලක් සමාලෝචිත වර්ෂයේදී වියදම්වලින් අඩුකිරීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ සත්‍ය වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(v) රු.286,551,044 ක් වූ ජාතිය ගොඩගැනීමේ බදු වියදම ප්‍රමිතයේ 103 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් යටතේ වර්ගකර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

(i) ප්‍රවර්ථන වර්ෂයේ ඇති නොවූ මෙන්ම සහ ආදායම් ප්‍රකාශයේද අඩංගු නොවන රු.82,494 ක වත්කම් ඉවත් කිරීමේ අලාභයක් ප්‍රමිතයේ 18(ආ) ඡේදයට පටහැනි ලෙස බදු පෙර ලාභයට එකතුකර තිබුණි.

(ii) ප්‍රවර්ථන වර්ෂයේ මුදලින් ගෙවන ලද ආදායම් බදු වටිනාකම රු.483,706,173 ක් වුවද ප්‍රමිතයේ 35 ඡේදයට අනුකූල නොවන ලෙස එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.498,037,403 ක් ලෙස දක්වා තිබුණි. මණ්ඩලයේ පොළී ආදායම් මත වූ රඳවාගැනීමේ බදු වටිනාකම ආදායම් බදු වටිනාකමට එකතු කර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබීම එයට හේතු වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ වරාය අධිකාරියට ගෙවීම් කරන ලද රු.1,371,712 ක දිගුකාලීන වගකීම්, ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. කෙසේ වුවද මෙම වගකීමට අදාල වර්ෂයේ ආරම්භක ශේෂය හා වර්ෂයේ අවසාන ශේෂයන් අතර වෙනස වූ රු.4,115,137 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේ දී මුදලින් කර ඇති ගෙවීම් රු.62,697,098 ක් වුවද ප්‍රමිතයේ 16(අ) ඡේදයේ උපදෙස් නොසලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.74,300,042 ක් ලෙස දක්වා තිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ලද සංචාරක බංගලා කුලී ආදායම හා වාහන කුලී ආදායම රු.1,768,785 ක් වුවද ප්‍රමිතයේ 16 ඡේදයේ උපදෙස් සැලකිල්ලට නොගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,728,365 ක් ලෙස දක්වා තිබුණි. ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ මුදලින් ලද රු.40,420 ක ආදායම සැලකිල්ලට නොගැනීම මෙම වෙනසට හේතු වී තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේ ත්‍යාග සංචිතයේ වෙනස්වීම වූ රු.430,370,642 ක වටිනාකම ප්‍රමිතයේ 35 ඡේදයට පටහැනි ලෙස මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(vii) විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන ණයගැතියන්ගෙන් ජනිත වූ විදේශ විනිමය විචලන ලාභය වූ රු.940,502 ක වටිනාකම එම ණයගැතියන්ගේ ආරම්භක ශේෂයට ගැලපීම් නොකර මුදල් පොතේ ආරම්භක ශේෂයට ගලපා තිබීම හේතුවෙන් වෙළඳ ණයගැතියන්ගේ විචලනය නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිරූපණය කර නොතිබුණි.

(viii) ඉහත සඳහන් පරිදි මෙම ප්‍රමිතයේ උපදෙස් නොසලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය තුළ නිරූපනය කරන තොග අඩුවීම රු.8,500,000 ක් වැඩියෙන් ද වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම රු.14,371,650 ක් අඩුවෙන් ද සහ වෙළෙඳ සහ වෙනත් වගකීමවල වැඩිවීම රු.8,507,299 ක වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12**

මණ්ඩලයේ ආදායම් බදු ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමග වූ සටහන් අංක 2.3.4 මගින් වාර්තා කර තිබුනද ප්‍රමිතයේ 61(ඒ) ඡේදයට අනුකූලවන පරිදි ආදායම් බදු සම්බන්ධයෙන් මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16**

මණ්ඩලය සතු නිෂ්ක්‍රිය වත්කම් සහ අගය සම්පූර්ණයෙන් ලියාහැර ඇති නමුත් තවදුරටත් භාවිතයට ගන්නා වත්කම්වල ධාරන අගය ප්‍රමිතයේ 79 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19**

සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලය විසින් සේවක පාරිතෝෂික ලෙස රු.52,031,249 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එයට සුදුසු සැලසුම් වත්කම් සකස් කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 135 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරි අලාභය හඳුනාගැනීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20**

මුදල් අමාත්‍යාංශය විසින් මණ්ඩලයට ප්‍රදානය කර තිබූ රු.5,795,000 ක මෝටර් රථයේ වටිනාකම ප්‍රමිතයේ 25 ඡේදයට පටහැනි ලෙස මුළුමනින්ම වෙනත් ආදායමක් ලෙස ඉකුත් වර්ෂයේදී ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. ප්‍රවර්තන වර්ෂයේදී ද එම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණ අතර ඒ අනුව තවදුරටත් රු.2,776,770 ශුද්ධ වටිනාකමක් ඇති මෙම මෝටර් රථය ප්‍රදානයක ස්වරූපයකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24**

(i) ප්‍රමිතයේ 17 ඡේදය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි 25 වන ඡේදය ප්‍රකාරව පහත සඳහන් කළමනාකරණ හා සේවක ප්‍රතිලාභ වර්ගවල එකතුන් වෙන් වෙන් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

- කෙටිකාලීන සේවක ප්‍රතිලාභ
- පශ්චාත් සේවා ප්‍රතිලාභ
- වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ
- සමාජ ප්‍රතිලාභ

(ii) ප්‍රමිතයේ 18 ඡේදය ප්‍රකාරව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු වුවත් ඊට පටහැනි ලෙස මණ්ඩලයේ වර්තමාන අධ්‍යක්ෂ ධූරය දරන සාමාජිකයකු එම ධූරය දැරීමට පෙර මණ්ඩලයේ දිස්ත්‍රික් අළෙවි නියෝජිතයෙකු ලෙස කටයුතු කළ කාලය තුලදී ඔහුට ගෙවිය යුතු රු.102,018 ක මුදල, ණයගැති ශේෂය තුල පැවතුනද එය වෙනමම හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40**

මණ්ඩලය සතු සංචාරක නිවාසවල වටිනාකම් ආයෝජන දේපල යටතේ නිරූපනය කර තිබුණද අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩමේ ඉදිකළ රු.1,086,820 ක කාර්යාල ගොඩනැගිලි පිරිවැය ද ආයෝජන දේපල යටතේ අනාවරණය කර තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලයේ උපචිත වියදම් සඳහා තාත්වික පදනමින් ප්‍රතිපාදන සැලසීම වෙනුවට අයවැය ගත දත්තයන් සැලකිල්ලට ගෙන උපචිත වියදම් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ උපචිත වියදම් අධි ප්‍රතිපාදනය රු.8,732,081 ක් වී තිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉතිරිව පැවති ලොතරැයිපත්වල සුන්බුන් අගය වූ රු.809,062 ක මුදල සඳහා ගිණුම්වල අවශ්‍ය ගැළපීම් සිදු නොකර ඒවායේ මුද්‍රණ පිරිවැය වූ රු.40,352,380 ක් වූ සම්පූර්ණ මුදලම විකුණුම් පිරිවැය තුළ අන්තර්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පවත්වන ලද දිනුම් වාරයන් වෙනුවෙන් ත්‍යාග සඳහා වෙන් කිරීම්වලින් ඉතිරිව පැවති රු.430,370,642 ක් රඳවාගත් ලාභයට නැවත ගැලපුම් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේදී අධිභාර හා ඒ මත වූ වෙනත් වියදම් ලෙස වරාය අධිකාරියට ගෙවන ලද රු.10,973,697 ක මුදලක් මණ්ඩලයේ වියදම් ලෙස සැලකිල්ලට ගෙන තිබුණි. මෙම වියදම ඉකුත් වර්ෂවලට අදාලව මණ්ඩලය විසින් පියවියයුතු වියදමක් බව නිරීක්ෂණය වූ අතර නව දේශීය ආදායම් පනතේ 10 ආ (iii) හා 11 (i) ඡේදයන්ට අනුව මෙම වියදම් ලාභයට එරෙහිව කපා හැරිය නොහැකි වියදම් බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ බදු වටිනාකම රු.3,070,635 කින් ඌන තක්සේරු වී තිබුණි.

(ඈ) ජාතික ලොතරැයි මණ්ඩලයට අදාල ආදායම් බදු අනුපාතිකය 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව සියයට 40 ක් වුවද 2018 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතට අනුව එය සියයට 28 ක් විය. ඒ අනුව මණ්ඩලයේ ගිණුම් කාල පරිච්ඡේදය ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වුවත් එම කාලපරිච්ඡේදයට අදාලව වාර්ෂික ආදායම් බදු වියදම ගණනය කිරීමේදී ඉහත සඳහන් පැරණි හා නව බදු ප්‍රතිශතයන් දෙකම අදාල විය යුතු වේ. 2018 ජනවාරි 01 දින සිට 2018 මාර්තු 31 දින දක්වා මුල් කාර්තුවට පැරණි පනතේ 203(1) ඡේදය ප්‍රකාරව ආදායම් බදු අනුපාතිකයද අනෙකුත් කාර්තු 03 සඳහා නව අනුපාතයද යොදා ගැනීම කළ යුතු වුවත් මණ්ඩලය විසින් සම්පූර්ණ වර්ෂය සඳහාම බදු අනුපාතිකය සියයට 28 ක් ලෙස යොදා ගෙන තිබුණි. ඒ අනුව මුල් කාර්තුව සඳහා ආදායම් බදු වියදම සියයට 12 ක් අඩුවෙන් තක්සේරු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) ඉකුත් වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමේ දී සැලකිල්ලට ගන්නා ලද එකතුව රු.17,681,257 ක් වූ ඉඩදිය නොහැකි වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ද අවශ්‍ය ගැළපීම් සිදුකර ඒ මත වූ ආදායම් බදු මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ රු.5,336,575 ක මුදලක් 2008 අප්‍රේල් 23 දිනැති අංක 1546/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රජයට පවරා ගෙන තිබුණද, ඒ සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකර එම මුදල ආයෝජන යටතේ තවදුරටත් දක්වා තිබුණි.

(උ) මණ්ඩලය විසින් ඉදිරියේදි පැවැත්වීමට නියමිත ඩොලර් ෆෝචුන් ලොතරැයියේ නොවිකිණි ඉතිරි වූ රු.142,636 ක් වටිනා ලොතරැයිපත් 3317 ක් විකුණුම් ලෙස සලකා අවසාන තොගයෙන් අඩුකර දක්වා තිබුණි.

(ඌ) කාර්ය මණ්ඩලය සඳහා මිලදීගත් බෙදා නොහැර ඉතිරි වූ වටිනාකම රු.730,625 ක් වූ ටී ෂර්ට් 1169 ක් හා නියෝජිතයින් අතර බෙදා නොහරින ලද රු.329,800 ක් වටිනා තෑගි වවුචර් 34 ක් තොග ලේඛනවලට ඇතුළත් වී නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළව නීති වියදම් රු.610,155 ක් හා නියෝජිත හා අමතර විකුණුම් ප්‍රවර්ධන වියදම් රු.145,000 ක මුදලක් උපචිත වියදම් ලෙස හඳුනා ගෙන නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණ වියදම්වල ඇතුලත්ව ඇති හිමිකම් නොපෑ රු.865,000 ක් අනුග්‍රහකත්වයන් උපචිත වියදම් ගිණුමේ දෙවරක් සටහන්වීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් උපචිත වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ප්‍රචාරණ කටයුතු යටතේ වූ අනුග්‍රාහකත්ව වියදම් ලෙස උපචිත වියදම් යටතේ ඉදිරියට ගෙන එමින් පැවති රු.10,072,500 ක උපචිත වියදම්වලින් 2018 වර්ෂයට අදාල වූ රු.2,047,500 ක වියදම් සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල හා ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත්

නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට මණ්ඩලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| නීති රීති/විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) 1997 අංක 35 දරන මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනත | |
| (i) 14(2) හා 16(1) හා 16(4) වගන්ති | මණ්ඩලය විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාර වෙනුවෙන් ලොතරැයි පැවැත්වීමේදී අදාළ ආයතන සමග ගිවිසුමකට එළඹිය යුතුය. එහෙත්, ගොවිසෙත, සුපිරි වාසනා, ජාතික සම්පත, නීරෝගා හා සෙවන ලොතරැයි වෙනුවෙන් අදාළ ආයතන සමග ගිවිසුම්ගතවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.5,204,004,004ක් ත්‍යාග ලෙස පිරිනමා තිබුණි. එසේ ගිවිසුම් ගත වීමකින් තොරව ලොතරැයි පැවැත්වීම හේතුවෙන් ජයග්‍රාහකයින් විසින් හිමිකම් නොපෑ ත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලයේ අභිමතය පරිදි කටයුතු කර තිබුණි. එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.<br>• ජයග්‍රාහකයින් 06 දෙනෙකු විසින් හිමිකම් නොපෑ ගුවන් ටිකට්පත්වල වටිනාකම වූ රු.2,306,400 ක මුදල ත්‍යාග සංචිත අරමුදලට බැරකිරීම.<br>• මාස 06 ඉක්ම වන ලද රු.12,762,192 ක් වූ හිමිකම් නොපෑ මුදල්මය නොවන ද්‍රව්‍යමය ත්‍යාග සම්බන්ධයෙන් විධිමත් පියවරක් අනුගමනය කර නොතිබීම.<br>• එකතුව රු.10,850,000 ක් වූ ත්‍යාග ලෙස හිමිකම් නොපෑ වාහන දෙකක් මණ්ඩලයේ පරිහරණය සඳහා යොදාගෙන තිබීම. |
| (ii) 17 (2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාළ වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් ඉකුත් වර්ෂවලට අදාළව එසේ බැර කිරීමෙන් තොරව රු.523,075,433 ක් රඳවා තබාගෙන තිබුණි. |

| | |
|---|---|
| (iii) 20(2)(1) වගන්තිය | මණ්ඩලය විසින් ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස්කර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවද 2013 වර්ෂයේ සිට හඳුන්වාදී තිබූ නව ලොතරැයි වන මෙගා පවර්, නීරෝගා, සුපිරි දෙලක්ෂපති, ධන නිධානය හා සෙවන යනාදි ලොතරැයි සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. මෙම ලොතරැයිවලින් රු.5,412,198,000 ක අලෙවි ආදායමක් උපයා තිබුණු අතර එම ආදායමින් රු.2,352,427,780 ක් ත්‍යාග සඳහා වෙන්කර තිබූ අතර රු.915,413,468 ක් අලෙවි නියෝජිත කොමිස් වෙනුවෙන් ගෙවා තිබුණි. |
| (ආ) 2009 අංක 08 දරණ මෝටර් රථ වාහන (සංශෝධිත) පනතේ 2 (අ)(1)(ඌ) වගන්තිය | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අවසරයක් නොමැතිව වාහනයක් විකරණය කිරීම හෝ වාහනයක නිර්මාණය යම් ආකාරයට වෙනස් කිරීම කළ නොහැකි වේ. එහෙත් මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී රු.20,750,000 ක් වැයකර මිලදීගත් සිංගල් කැබ් රථ 06 ක බඳ කොටස ඩබල් කැබ් රථයක් ලෙස මතුපිටින් පෙනෙන ලෙස නවීකරණයට ලක්කර ඒ සඳහා රු.1,625,000 ක් වැයකර තිබුණද ඒ සඳහා විධිමත් පරිදි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) viii වන පරිච්ඡේදයේ 10.1 ඡේදය හා 10.2 ඡේදය | සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දිනවල රාජකාරීවල නිරත වීම වෙනුවෙන් පැය 08 කට නොඅඩු එක් දිනක් සඳහා වැටුපෙන් 1/20 ක දීමනාවක් ලබාදිය හැකි වුවද එම විධිවිධාන නොසලකා දිනකට පැය 12 ඉක්මවා රාජකාරි ඉටුකරන සෑම එක් දිනක්ම දින දෙකක් රාජකාරී කළ සේ සලකා ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ දින දෙකක් සේ සැලකූ අවස්ථා 60ක් වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.184,000 ක් විය. තවද, සතියේ වැඩ කරන දිනයන්ද රජයේ නිවාඩු දිනයන් සේ සලකා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අවස්ථා 40 ක් නිරීක්ෂණය වූ අතර එසේ ගෙවා තිබූ මුදල රු.68,706 ක් විය. |

| | | |
|---|---|---|
| (ii) | xxiv පරිච්ඡේදයේ 11 වන වගන්තිය සහ 2018 ජනවාරි 23 දිනැති PE/LO/NLB/COPE/2018 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබා දීම බැංකු මගින් පමණක් සිදු කළ යුතු අතර ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින්ද අවධාරණය කර තිබුණි. එම විධිවිධාන පිළිබඳ නොසලකා සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 13 දෙනෙකු වෙත රු.18,183,883 ක මුදලක් දේපල ණය ලෙස මණ්ඩලයේ මුදල් උපයෝගී කර ගෙන ලබාදී තිබුණි. එසේම දේපල ණය සඳහා විධිවිධාන ප්‍රකාරව නිලධාරියාගෙන් අය කරගත යුතු පොළිය නොසලකා සෑම නිලධාරියෙකුටම සියයට 4 ක අවම පොළී අනුපාතය යටතේ ණය ලබා දී තිබුණි. |
| (iii) | xxiv පරිච්ඡේදය | අනුමත විධිමත් බඳවා ගැනීමේ පරිපාටියට සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන නොසලකා මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවිකරණ/ ප්‍රවර්ධන තනතුර සඳහා අයකු බඳවාගෙන 2018 ඔක්තෝබර් 01 දින සිට මේ දක්වා වැටුප් හා දීමනා ගෙවමින් පැවතුණි. |

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 103(1), 104(3), 104(4), සහ 1642 | 2017 හා 2018 වර්ෂයන් තුලදී මණ්ඩලය සතු වාහන සඳහා සිදු වී තිබූ අනතුරු 16 ක් සම්බන්ධ විධිමත් පරීක්ෂණයන් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර නොතිබුණි. එසේම අනතුරු සම්බන්ධයෙන් ලඟම ඇති පොලිසියට ද වාර්තා කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 394 | 2016 වර්ෂයේ සිට මණ්ඩලය ලබාගත් සේවාවන් සහ අනෙකුත් වියදම් සඳහා ගෙවීම් වෙනුවෙන් නිකුත් කර තිබූ රු.2,801,747 ක් වටිනා චෙක්පත් 244 ක් අදාල ගෙවීම් ලාභීන්ට ලබානොදී ආයතනය තුළම රඳවාගෙන අවලංගු කර තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 702 (3) | කොන්ත්‍රාත් ගිවිසුම් පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ලොතරැයි මුද්‍රණය, ප්‍රචාරණය හා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වූ ගිවිසුම් සඳහා එසේ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (iv) මුදල් රෙගුලාසි 754, 756, 757,758 හා 770 | විධිවිධාන ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු පවත්වා නොතිබුණි. |
| (ඉ) 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2015 මැයි 25 දිනැති අංක 01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) නිල වාහන සඳහා හිමිකම ඇති නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් මාසිකව ලබාදිය හැකි ඉන්ධන දීමනා සීමාව ඉක්මවා රු.1,402,219 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br>(ii) නිල වාහන හිමිකම් නොමැති කලාප කළමනාකරුවන් 24 ක් සහ අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් 17 ක් සඳහා ඉන්ධන දීමනාවක් සහ තමාගේ පුද්ගලික වාහනය භාවිතා කරන්නේ නම් අතිරේක මාසිකව දීමනාවක් ද ලෙස නිලධාරීන්ගේ වැටුපට එකතු කර සමාලෝචිත වර්ෂය තුලදී රු.5,237,409 ක දීමනා ගෙවා තිබුණි. |
| (ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ<br>(i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය | |
| • 6.5.1 ඡේදය | මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන වී ඊළග වර්ෂයේ පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ 2019 ජුනි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| • 8.3.9 ඡේදය | මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා නොදිය යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් 05 දෙනෙකු සහ රු.11,276,786 වටිනා මෝටර් වාහන 03 ක් මුදල් අමාත්‍යාංශය සඳහා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මුදා හැර තිබුණි. තවද, එම නිලධාරීන් වෙත මණ්ඩලයෙන් ගෙවා තිබූ සේවක පාරිශ්‍රමික හා දිරි දීමනා මුදල වූ රු.1,800,323 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. |
| • 9.12 ඡේදය | (i) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2006 වර්ෂයේ මණ්ඩලය විසින් අසරණ සරණ අරමුදල නමින් අරමුදලක් ආරම්භ කර ඒ සඳහා ලොතරැයි ත්‍යාග ලාභීන්ගෙන් ලද පරිත්‍යාග සහ ''නිරෝගා'' ලොතරැයි |

| | |
|---|---|
| | අලෙවි ආදායමෙන් සියයට 0.5 ක ප්‍රතිශතයක් එම අරමුදලට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම අරමුදලේ රු.14,016,057 ක ශේෂයක් පැවතුණි.<br>(ii) මණ්ඩලයේ සභාපතිනියගේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය සඳහා රු.19,129,643 ක සුභසාධක දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙම දීමනාව ඉකුත් වර්ෂවලදී ද ගෙවා තිබුණි. |
| (ii) **1994 ජුනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය** | (i) භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දිරිදීමනා ලෙස එසේ ගෙවා ඇති මුදල රු.97,228,123 ක් විය.<br>(ii) රජයේ අනුමත සංයුක්ත දීමනාව වෙනුවට එක් දිනකට උපරිම ලෙස රු.3,000 දක්වා වූ විශේෂ ප්‍රවර්ධන දීමනාවක් කාර්ය මණ්ඩලයට ලබාගත හැකි වන පරිදි විධිවිධාන සලසා තිබුණද ඒ සඳහා නිශ්චිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එසේ ගෙවා ඇති මුදල රු.4,910,750 ක් විය. |
| (iii) **2015 මැයි 25 දිනැති අංක පීඊඩී/2/2015 දරන චක්‍රලේඛය** | දුරකථන දීමනා ලබන නිලධාරීන් 09 ක් විසින් අනුමත සීමාව ඉක්මවා ලබාගත් ඇමතුම් වෙනුවෙන් රු.343,463 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. |
| (iv) **2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ 2.5 ඡේදය** | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.343,486 ක දිරිදීමනාවක් ගෙවා තිබුණි. |
| (v) **2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන චක්‍රලේඛය** | මණ්ඩලය විසින් වාර්ෂික ප්‍රචාරණ සැලැස්මක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රචාරණ වියදම් වශයෙන් රු.1,023,507,765 ක් ගෙවා තිබූ අතර ඉකුත් වර්ෂයේදී එසේ ගෙවා තිබුණු මුදල රු.940,272,567 ක් විය. |

| | |
|---|---|
| **(උ) 1993 ජනවාරි 21 දිනැති අංක PE1/70/7/Vo11 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය** | රජය වෙනුවෙන් පවත්වනු ලබන සියලු ලොතරැයිවලින් ලැබෙන ආදායමෙන් සියයට 16.5 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබූ මෙගා පවර් හා ධන නිධානය යන ලොතරැයි වර්ග 02 ක ආදායමින් සියයට 10 ක වටිනාකමක් පමණක් ප්‍රේෂණය කිරීම නිසා තවදුරටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකළ වටිනාකම රු.200,901,108 ක් විය. |

- **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

- **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) මණ්ඩලය විසින් වෙළෙඳපොළට ඉදිරිපත් කර ඇති ක්ෂණික ලොතරැයි වර්ග දෙකක මුද්‍රණ කටයුතු සඳහා වූ ගිවිසුම්ගත කාලය 2015 මැයි 31 න් අවසන් වී තිබුණද 2019 මැයි 31 දක්වා නව මුද්‍රණකරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.2,400,000 ක් වැයකර මිලදී ගෙන තිබූ සූර්ය පැනල 500 කින් 2019 ජූනි 16 දින වන විටත් සූර්ය පැනල 474 ක තොගයක් ගබඩාවේ පැවතුණි. මෙම ප්‍රසම්පාදනයේදී අවශ්‍යතාවය මෙන්ම ප්‍රතිලාභීන් ද නිශ්චය කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී මණ්ඩලය විසින් ප්‍රවර්ධන අයිතමයන් වර්ග 31 ක් වෙනුවෙන් රු.118,964,725 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම වර්ෂය තුළදී ප්‍රසම්පාදන කටයුතු නිමකර තිබුණේ අයිතම 6 ක් පමණක් වූ අතර ඒවායේ වටිනාකම රු. 21,569,725 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී රු.13,128,900 ක් වටිනා ලොතරැයි අලෙවි කුටි 300 ක් නිෂ්පාදනය කර සැපයීමට 2019 පෙබරවාරි මස ඇනවුම් ලබා දී තිබුණ ද 2019 ජූලි 10 දින වන විටත් සපයා තිබුණු අලෙවි කුටි සංඛ්‍යාව 50 ක් පමණක් විය. අදාල සැපයුම්කරු සමඟ ඒ සඳහා ගිවිසුමකට එළඹී නොතිබූ අතර ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර අපේක්ෂිත අලෙවි ප්‍රවර්ධන අයිතමයන් සඳහා පමණක් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි.

(ඊ) 2016 ජුලි මාසයේදී හා 2018 මැයි මාසයන්වලදී ආරම්භ කළ සෙවණ හා ධන නිධානය යන ලොතරැයි 02 හි මුද්‍රණ කටයුතු ප්‍රසම්පාදනයකින් තොරව මුද්‍රණකරුවන් දෙදෙනෙකු වෙත අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකින් පවරාදී තිබුණි. අදාල මුද්‍රණ කටයුතු සිදු කිරීමේදී ඇති වූ මුද්‍රණ දුර්වලතාවයන් නිසා පසුව එම කටයුතු යලිත් වෙනත් ආයතන දෙකකට පවරා තිබු බව නිරීක්ෂණය විය. එසේම මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ මෙහෙයවා තිබුණු ලොතරැයි වර්ග 11 කින් ලොතරැයි වර්ග 06 ක් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව මුද්‍රණකරුවන් තෝරාගෙන තිබුණි.

(උ) මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන මහජන සම්පත ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2008 වර්ෂයේ සිටද නීරෝගා ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2015 වර්ෂයේ සිටද මෙගාපවර් ලොතරැයියේ මුද්‍රණ කටයුතු 2018 වර්ෂයේ සිටද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව විසින් මේ දක්වා ඉටු කර තිබුණද, ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොවීය. 2016 වර්ෂය තුළදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් එක් ටිකට්පතක් මුද්‍රණය කිරීම සඳහා ලැබී ඇති අවම මිල රු.0.3570 ක් වුවද රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත මහජන සම්පත, නීරෝගා සහ මෙගාපවර් යන ලොතරැයිපතක මුද්‍රණ පිරිවැය ලෙස 0.50231ක් ගෙවමින් පැවතුණි. තරඟකාරී මිල ගණන් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පමණක් මහජන සම්පත ලොතරැයිපත් මුද්‍රණයෙන් සිදුවිය හැකි ඇස්තමේන්තු කළ හැකි අලාභය රු.44,804,393ක්ද, නීරෝගා ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තු කළ හැකි අලාභය රු.8,474,222ක්ද සහ මෙගා පවර් ලොතරැයිපත් මුද්‍රණයෙන් ඇස්තමේන්තු කළ හැකි අලාභය රු.17,858,050 ක්ද වශයෙන් පැවතුණි.

(ඌ) 2018 වර්ෂයේ පරිගණකාශ්‍රිත ලොතරැයිපත් මුද්‍රණය සම්බන්ධයෙන් වූ පිරිවිතරයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනි ලෙස පිරිවැය අඩු කඩදාසි භාවිතා කර අදාල ලොතරැයිපත් මුද්‍රණය කර තිබු බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම මුද්‍රණකරුවන් විසින් නියමිත ප්‍රමිතීන් ආරක්ෂා වන පරිදි අදාල මුද්‍රණයන් සිදුකර නොතිබු අවස්ථාද වූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2019 ජනවාරි 13 දින පැවැත්වූ ගොවිසෙත දිනුම් වාරයේදී අදාල මුද්‍රණකරු විසින් ලොතරැයිපත් 30 ක් දෙවරක් මුද්‍රණය කර සපයා තිබුණි.

(එ) මණ්ඩලය විසින් ලොතරැයිපත් මිලදී ගන්නන්ගේ ආරක්ෂාවට සියලුම දත්තයන් QR Code එකකට ඇතුලත් කර මුද්‍රණය කරන ලෙස මුද්‍රණකරුවන්ට උපදෙස් දී තිබුණද අදාල මුද්‍රණකරුවන් විසින් එම ආරක්ෂිත ක්‍රමවේදය අනුගමනය කරන්නේද යන්න පරීක්ෂා කිරීමේ උපකරණ මණ්ඩලය සතුව නොපැවතුණි. එසේම ජයග්‍රාහකයින් විසින් ඉදිරිපත් කරන ලොතරැයිපත් වෙනුවෙන්ද එම පරික්ෂාව මණ්ඩලය විසින් ඉටු කර නොතිබුණි.

(ඒ) මණ්ඩලය විසින් කුළියට ලබාගත් වර්ග අඩි 26000 ක ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ලබාදුන් මාසික තක්සේරු වටිනාකම රු.3,750,000 ක් වුවද ඒ සඳහා ගෙවනු ලබන මාසික කුළී වටිනාකම රු.7,677,173 ක් විය. එයට යාබදව යකඩ කණු මත ඉදිකළ වර්ග අඩි 4885 ක ගොඩනැගිල්ලක් රු.1,099,125 ක මාසික කුළියට ලබාගෙන තිබුණද එම

ගොඩනැගිලි සඳහා වූ සැලැසුම, පදිංචියට සුදුසු බවට සහතිකය, නගරසභා අනුමැතිය හා තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම යනාදිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී වර්ග අඩි 40,000 කට නොඅඩු යනුවෙන් ටෙන්ඩර් කැඳවීම මත බොහෝ ගොඩනැගිලි හිමිකරුවන්ට අයදුම් කිරීමට තිබුණු අවස්ථා අහිමි වී තිබූ අතර අවශ්‍ය විදුලි ධාරිතාවය පිළිබඳ සොයා බලා නොමැති වීම හේතුවෙන් මාසිකව රු.1,011,840 ක විදුලි වියදමක් දරා තිබුණි.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී වැඩිපුර ගෙවනලද රු.7,392,287 ක සේවක පාරිතෝෂික මුදල නැවත මණ්ඩලයට අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබුණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාළ විශ්‍රාමික නිලධාරීන්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 04 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබාදී තිබූ නියෝගය අනුව, මණ්ඩලය සතු වොක්ෂෝල් වීදියේ පිහිටි පර්චස් 112 ක ඉඩමේ නව ගොඩනැගිල්ලක් ඉදිකළ යුතු විය. එහෙත් 2016 වර්ෂය අවසාන වන විටද ගොඩනැගිල්ලේ සැලසුම් කටයුතු සඳහා ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම පමණක් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම 2019 මැයි 31 දක්වා ආරම්භ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ කාර්යාල හා ගබඩා කටයුතු පවත්වාගෙන යාමට ලබාගෙන තිබුණ ගොඩනැගිල්ල වෙනුවෙන් මාසිකව රු.9,336,994 ක් වැට් බදු සහිතව ගෙවමින් පැවතුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය අලාභය රු.136,267,795 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.139,805,208 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.276,073,003 ක පසුබෑමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී නිරීක්ෂණය වූයේ සමාලෝචිත වර්ෂයේදී එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 197 කින් පිරිහී ඇති බවයි. කෙසේ වුවද මෙම මූල්‍ය ප්‍රතිඵලයට, සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය

සහ රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2014 වර්ෂයේ සහ 2017 වර්ෂයේ දායකත්වයේ අඩුවීමක්ද 2015 සහ 2016 වර්ෂවල වර්ධනයක්ද නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) | (රු.මිලියන) |
| බදු පසු ශුද්ධ ලාභය (ලාභාංශ ගෙවීමට පෙර) | (136,267,795) | 139,805,208 | 414,761,431 | 241,016,039 | (8,663,584) |
| සේවක පාරිශ්‍රමික | 420,862,040 | 375,410,032 | 380,279,707 | 320,462,652 | 267,215,394 |
| <u>රජයට ගෙවූ බදු</u> | | | | | |
| ආදායම් බදු | 1,174,402,368 | 484,610,312 | 482,128,237 | 669,785,229 | 117,853,496 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 286,551,044 | 235,767,246 | 285,776,997 | 253,267,754 | 211,761,787 |
| එකතු කළ අගය මත බදු | 890,352,095 | 742,298,500 | 706,868,280 | 573,252,862 | 540,502,194 |
| ඒකාබද්ධ අරමුදලට සිදු කළ දායකත්වය | 2,426,947,888 | 2,016,986,336 | 2,445,594,544 | 2,130,953,970 | 1,888,455,133 |
| <u>ක්ෂය වීම</u> | | | | | |
| මෝටර් රථ ක්ෂය වීම | 19,290,936 | 55,627,510 | 54,979,532 | 48,727,716 | 33,000,569 |
| අනෙකුත් ක්ෂය වීම | 60,229,778 | 70,474,209 | 68,497,174 | 60,061,990 | 26,090,623 |
| | 5,142,368,354 | 4,120,979,353 | 4,838,885,902 | 4,297,528,212 | 3,076,215,612 |

(ආ) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී ජංගම ප්‍රචාරණ රථ 21 ක් සඳහා රියදුරු හා ප්‍රචාරක නිලධාරියකු බැගින් යොදවා රු.158,125,880 ක් වටිනා ලොතරැයිපත් අලෙවි කර තිබුණි. එම අලෙවියන් මත සියයට 17.5 ක විකුණුම් කොමිස් ලෙස රු.27,672,029 ක මුදලක් කිසිදු ලේඛනගත සාක්ෂියකින් තොරව එම කාර්යයේ නියුතු නිලධාරීන් වෙත ලබාදී තිබුණි. අදාල අංශයේ කාර්යභාරය, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් ස්ථාපිත වී නොතිබූ අතර ලොතරැයි අලෙවි කිරීමේ කාර්යයට යොදා ගනු ලබන වාහන වෙනුවෙන් යොදන ලද ඉන්ධන විස්තර ද ධාවන සටහන්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන විවිධ අරමුදල් 04 ක් විගණනය කිරීම සඳහා පෞද්ගලික විගණකවරුන් වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.119,000 ක් ද ඉකුත් වර්ෂයේ දී රු.235,000 ක් ද වශයෙන් එකතුව රු.354,000 ක් මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි. මෙම විගණන ගාස්තු අදාල අරමුදලින් නොගෙවා මණ්ඩලයේ අරමුදලින් ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ලියාපදිංචි අලෙවි නියෝජිතයින්ගෙන් ඇප බැඳුම්කර ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අවධාරණය කර තිබුණද ඒ සඳහා ක්‍රියානොකර 2016 ජුලි සිට 2017 ජුලි දක්වා කාලයට රු.8,290,055 ක අමතර පිරිවැයක් මණ්ඩලය විසින් දරා ණයවර රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණි. ඒ සඳහා 2016, 2017 වර්ෂ

වෙනුවෙන් නොගෙවා ඇති රු.23,365,438 ක ණය ශේෂය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) මණ්ඩලයේ අරමුදල්වලින් ලබාදී තිබූ දේපල ණයවලට අදාළ ඔප්පු 110 ක් වෙනුවෙන් අවලංගු කළ නොහැකි අටෝර්නි බලය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මණ්ඩලය විසින් එහි ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් 2003 වර්ෂයේදී හඳුන්වා දී තිබූ මධ්‍යගත පරිගණක මෘදුකාංගය 2016 වර්ෂයේදී විමධ්‍යගත කර තිබීම හේතුවෙන් එම මෘදුකාංගයෙන් ලබාගත හැකි සේවාවන් සීමිත වී තිබුණි. කලින් පැවති මධ්‍යගත ක්‍රමය මගින් ආයතනයේ ගනුදෙනු පිළිබඳව පැවති විශ්වාසනීයත්වයද මෙම විමධ්‍යගත ක්‍රමය යටතේ ප්‍රශ්නගත වී තිබුණු අතර, අදාළ වෙනස් කිරීම් නිසා ඇතිවන අවදානම්වල වගකීම භාර ගැනීම මෙම මෘදුකාංගය හඳුන්වාදුන් සමාගමද ප්‍රතික්ෂේප කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් මුද්‍රණය කරවා ගනු ලබන ලොතරැයිපත්වල අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය නොකර මුද්‍රණ ඇනවුම් ලබාදීම හේතුවෙන් වර්ෂය තුළදී මුද්‍රිත ලොතරැයිපත්වලින් සියයට 9 පමණ ප්‍රමාණයක් නොවිකිණී ඉතිරිව පැවතුණි.

(ඌ) 2017 වර්ෂයේ දී ප්‍රසම්පාදන කටයුතු සිදුකළ රු.6,110,000 ක් වටිනා මහජන ඇමතුම් 650 න් මහජන ඇමතුම් 180 ක් 2019 මැයි 31 දින වන විටත් බෙදා නොහැර ගබඩාවේ පැවතිණි. 2018 වර්ෂය අවසානය වන විටද එම භාණ්ඩවල ගුණාත්මකභාවය, කල්පැවැත්ම හා නියෝජිතයන්ට ඒවායේ අවශ්‍යතාවය යනාදිය පිළිබඳ විධිමත් අධ්‍යනයක් සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවිය.

(එ) මණ්ඩලය සතු බැංකු ගිණුමට වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට බැරකර තිබූ රු.6,033,355 ක ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වූ රු.220,000 ක වටිනාකමකින් යුත් තැන්පතු සඳහා නියමිත සේවාවක් ලබාගෙන අවසන් වී ඇතත් ඒවා නිරවුල් කිරීම සිදුකර නොතිබුණි. තවද රු.102,500 ක් වටිනා තැන්පතුවක් පෞද්ගලික සමාගමක් වෙත ලබා දී තිබුණද, මණ්ඩලය විසින් ලබාගත් වතුර බෝතල් සහ ජල කරාම (Dispenses) කැඩී තිබීම නිසා එම අගය නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතු අංක BMW (A1) 5860 මෝටර් රථය නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) 2010 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.1,000,000 ක් වටිනා ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍රයක් සඳහා මණ්ඩලය විසින් තවදුරටත් රු.329,693 ක අළුත්වැඩියාවක් දරා තිබුණද මේ වන තෙක් එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### 3.4 ආර්ථික නොවන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ගිණුමට අලෙවි නියොජිතයින් විසින් මුදල් තැන්පත් කිරිමේදි බැංකුව විසින් සියයට 0.05 සේවා ගාස්තුවක් අයකර තිබුණි. එම ගාස්තු ගණනය පිළිබඳ තොරතුරු මණ්ඩලය සතු නොවූ අතර ඒ සඳහා ලිඛිත ගිවිසුමක් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ද ඉදිරිපත්නොවුණි.2018 වර්ෂය වෙනුවෙන් බැංකුව අයකළ ගාස්තුව රු.41,591,442 ක් වූ අතර පසුගිය වර්ෂ 05 තුළදී එසේ ගෙවා තිබූ ගාස්තුව රු.171,443,373 ක් විය. මෙම ගාස්තුව අඩුකර ගැනීම සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් මණ්ඩලය විසින් ගෙන නොතිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) 32 වන කලම්බු එයාර්පොට් සුපර් ඩ්‍රෝ හා ඩොලර් ෆෝචූන් ලොතරැයිපත් අලෙවිය එක්සත් ජනපද ඩොලර්වලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකළද එම සියලු ලැබීම් මණ්ඩලයේ ගිණුමට බැරකළ යුත්තේ එක්සත් ජනපද ඩොලර්වලින් විය. ඒ අනුව ශ්‍රී ලංකා රුපියල් මගින් එකතු කරගත් මුදල් එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කර ගැනීම සඳහා පෞද්ගලික මුදල් මාරු කරන්නන් සමඟ කටයුතු කිරීමට අලෙවි අංශයේ නිලධාරීන්ට අවිධිමත් අවසරයක් ලබා දී තිබුණි.

(ඇ) ආයතනයේ නෛතික සේවාවක් සඳහා තනතුරක් ඇතිකර ඒ සඳහා නීති නිලධාරියෙකු බඳවාගෙන සිටියද මණ්ඩලයේ විවිධ නීති සේවා ප්‍රසම්පාදනයකින් තොරව බාහිර නීතිඥ ආයතන මගින් සිදුකරවා ගෙන තිබුණි. තවද අදාල නීති සේවාවන් නීතිපති දෙපාර්තමේන්තුව මගින්ද ලබාගැනීමේ හැකියාව පිළිබඳ සොයා බලා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එසේ ලබාගත් නීති සේවාව වෙනුවෙන් රු.2,189,109 ක් වැයකර තිබුණි. තවද කොළඹ වාණිජ මහාධිකරණයේ විභාග වන නඩුවක එක් එක් නඩුවාරය සඳහා නීතිඥ මහත්වරුන් තිදෙනෙකු බැගින් යොදවා නඩුවාර 05 ක් සඳහා ගෙවා ඇති නීතිඥ ගාස්තුව රු.471,750 ක් විය.

(ඇ) නිර්මාණාත්මක ප්‍රචාරණ නියෝජිත ආයතන විසින් නිෂ්පාදනය හා සංස්කරණය නිමකර මණ්ඩලයට ඉදිරිපත් කරන ප්‍රචාරණ දැන්වීමට අදාල සියළුම ගෙවීම් කිරීමෙන් පසුව ද, එම දැන්වීම් අදාල මාධ්‍යයන්වල ප්‍රචාරණය වන සෑම වාරයක් පාසාම එම ප්‍රචාරණ ආයතනයට මුළු සේවා ගාස්තුවෙන් සියයට 11.5 ක් අනාර්ථිකව ගෙවීම් කරමින් පැවතුණි. 2018 වර්ෂය තුළදී පමණක් එලෙස රු.36,724,054 ක් ගෙවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) ජාතික ලොතරැයි මණ්ඩලයේ දෛනික ලොතරැයි දිනුම් ඇදීම් රූපවාහිනිය විකාශනය කිරීම සඳහා අතරමැදි ආයතන ලෙස ප්‍රචාරණ සමාගම්වල සහාය ලබාගත් බවට වාර්තා කර ඒ සඳහා සියයට 15 ක සේවා ගාස්තුවක් ප්‍රචාරණ ආයතනවලට ගෙවා තිබුණි. එහෙත් එවැනි සහායකින් තොරව දැනට පවත්වනු ලබන සෙවණ ලොතරැයිය සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය යොදාගැනීම තුලින් 2018 වර්ෂයේදී පමණක් රු.5,738,357 ක් ඉතිරි කර ගැනීමට හැකිව තිබුණි. එහෙත් අනෙකුත් ලොතරැයි 10 ක් වෙනුවෙන් එසේ කටයුතු නොකර එම කටයුතු ප්‍රචාරණ නියෝජිතායතන මගින් ලබාගත් බව වාර්තා කරමින් රු.65,256,074 ක් අනාර්ථික ලෙස වැය කර තිබුණි.

(ඊ) සරල අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයි සඳහා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය මගින් සිදුකරන සන්නාමයන් ලියාපදිංචිය සෘජුවම කරවා ගැනීමට හැකියාව තිබියදී ඒ සඳහා බාහිර නීතිඥ සමාගම් යොදාගෙන සමාලෝචිත වර්ෂය තුළදී එම සමාගම් සඳහා රු.296,305 ක මුදලක් අනාර්ථික ලෙස ගෙවා තිබුණි.

### 3.5 කාර්යසාධනය

#### වෙළෙඳපොල කොටස

සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සියයට 58.16 ක් වී තිබූ අතර එකම තරඟකාරි ආයතනය වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වෙළඳපොල කොටස සමග සැසඳීමේදී එය 2017 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 3.66 කින්ද 2016 ට සාපේක්ෂව සියයට 1.32 කින්ද ඉහළ ගොස් තිබුණි.

### 3.6 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය ආරම්භ කර වසර ගණනාවක් ගතවී තිබුණද ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි. එසේම 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය සාධන ඇගයීම් සඳහා කාර්ය සාධන මිනුම් දඬු සහ කාර්යසාධන වාර්තාවක් පිළියෙල කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2017 හා 2018 වර්ෂයන්ට අදාළ මණ්ඩලයේ ලොතරැයිපත් ආදායම හා ප්‍රවාරණ වියදම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) ඉකුත් වර්ෂයේ අලෙවි කර තිබුණු ලොතරැයි වර්ග 13 න් සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි වර්ග 02 ක් නවතා තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 07 ක ආදායම ඉහළ ගොස් තිබුණද, ලොතරැයි වර්ග 04 ක ආදායම පහල ගොස් තිබුණි. ඒ අනුව සමස්ථ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 4,404 කින් වැඩි වී තිබු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 26.6 ක් වේ.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වාසනා සම්පත ලොතරැයියේ ආදායම සියයට 48 කින් අඩුවන විට ප්‍රවාරණ වියදම අඩු වී තිබුණේ සියයට 30 ක් පමණි. සුපිරි වාසනා ලොතරැයි ආදායම සියයට 6 කින් අඩුවන විට එහි ප්‍රවාරණ වියදම සියයට 9 කින් ඉහළ ගොස් තිබුණි.

(iii) රු.මිලියන 4,885 ක ඉහලම ආදායමක් උපයා ඇති මහජන සම්පත ලොතරැයියේ ප්‍රවාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 2.9 ක් ලෙස පහලම අගයක් ගෙන තිබුණද රු.මිලියන 1,162 ක ආදායමක් උපයා ඇති සම්පත් රේඛා ලොතරැයියේ ප්‍රවාරණ පිරිවැය විකුණුම් ආදායමින් සියයට 8 ක ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේදී පැවැත්වූ ලොතරැයි දිනුම්වාර සංඛ්‍යාව 1292 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එම සංඛ්‍යාව 1415 ක් දක්වා දිනුම්වාර 123 කින් වැඩි වී තිබුණි. ලොතරැයි අලෙවි ආදායම පසුගිය වර්ෂයට වඩා රු.3,691,463,220 කින් හෙවත් සියයට 22.04 ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබු දිනුම් වාර සංඛ්‍යාව හා ප්‍රදානය කළ සුපිරි ත්‍යාග හා අනෙකුත් මුදල් ත්‍යාග ව්‍යුහය සැලකිල්ලට ගත් විට රු.2,000 ට වඩා අඩු ත්‍යාග ලාභීන්ගේ ප්‍රතිශතය සියයට 99 කට වැඩි අගයක් ගෙන තිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී සහ විශේෂ ව්‍යාපෘති උපදේශක ලෙස නව තනතුරු වර්ග 02 ක් සඳහා පිළිවෙලින් නිලධාරීන් තිදෙනෙකු සහ එක් නිලධාරියෙකු බඳවා ගෙන රු.1,200,000 ක් වැටුප් ලෙස ගෙවීම් කර තිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාවය නොමැතිව මණ්ඩලයේ අනුමත මූල්‍ය නිලධාරී තනතුර යටපත් කර අලෙවි/ප්‍රවර්ධන නිලධාරී තනතුරක් ඇතිකර තිබුණි. එම තනතුර සඳහා නිශ්චිතව සුදුසුකම් සඳහන් කිරීමෙන් තොරව කළමනාකරණ සහකාර තනතුරක් දරන අයකු 2017 අගෝස්තු 08 දින සිට පත්කර තිබුණි. එම තනතුරට පත් කළ නිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්භනය කරන ලෙස නියෝග කර තිබියදී එසේ කටයුතු කිරීමකින් තොරව නව තනතුරේ වැටුප් ගෙවීම් කර තිබුණි.

(ඇ) මණ්ඩලයේ කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ 5.4 ඡේදය ප්‍රකාර ප්‍රසිද්ධ දැන්වීම් පළකර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මත අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටි අය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වුවත් නියමිත අධ්‍යාපන සහතික ඉදිරිපත් නොකළ 04 දෙනෙක්ද බඳවාගෙන සිටි බව නිරීක්ෂණය විය.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ අනුමත නොවූ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ 12 දෙනෙකු වූ අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවකයින් 01 ක්, සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් 11 ක් ඇතුළත් විය.

## 3.8 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ණය පදනම මත අලෙවි නියෝජිතයන්ට 2013 සිට 2017 දක්වා නිකුත් කර තිබූ ලොතරැයි අලෙවි කුටි වෙනුවෙන් අයවිය යුතු රු.6,083,363 ක් ද අලෙවි නියෝජිතයින් 45 කට ලබාදී තිබූ පාපැදි වෙනුවෙන් 2016 වර්ෂයට හා ඊට පෙර සිට අයවිය යුතු රු.362,638 ක්ද වශයෙන් එකතුව රු.6,446,001 ක් වූ වාරික මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අලෙවි නියෝජිතයින් 91 දෙනෙකුගෙන් 31 දෙනෙකු පමණක් ඇප බැඳුම්කර තබා තිබුණි. නියමිත ඇප සීමාව ඉක්මවා රු.19,819,533 ක් ද ඇප බැඳුම්කර ඉදිරිපත් නොකල අලෙවි නියෝජිතයින් 89 කට රු.139,282,243 ක් ද වශයෙන් ක්ෂණික ලොතරැයිපත් ද නිකුත් කර තිබුණි. ණය අයකර ගැනීමේ දුර්වලතා මත 2016 වර්ෂයේදී අලෙවි නියෝජිතයින් 29 කට ණයට අලෙවි කළ රු.23,365,438 ක් වූ ක්ෂණික ලොතරැයිපත් වෙනුවෙන් අයවිය යුතු මුදල් 2019 මැයි 31 දින වන විටත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2007 වර්ෂයේ දි මණ්ඩලයේ සේවකයන් දෙදෙනෙකුට රු.1,003,038 ක් වටිනා ලොතරැයිපත් ණයට නිකුත්කර තිබුණි. 2019 ජුනි 30 දින වනවිටත් ඔවුන්ගෙන් එම මුදල අය වී නොතිබුණි. වර්තමානයේදි එක් නිලධාරියකු සක්‍රිය සේවයේද නොමැති බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ඇ) මණ්ඩලය විසින් 2013 වර්ෂයේ සිට අදාල වගකීම් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව උපචිත වියදම් යටතේ වෙන්කර තිබූ එකතුව රු.9,085,823 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.212,276,805 ක් වූ වෙළඳ ණයගැති ශේෂ තුළ කලම්බු එයාර්පොට් සුපිරි ලොතරැයිය වෙනුවෙන් රු.4,728,146 ක්ද සහ අලෙවි නියෝජිතයන්ගෙන් වර්ෂ 3කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.30,983,156 ක්ද පැවති අතර අලෙවි නියෝජිත ශේෂ තුළ මියගිය අලෙවි නියෝජිතයන් දෙදෙනකුගෙන් අයවිය යුතු රු.559,300 ක්ද විය. මෙම වටිනාකම් සම්බන්ධ අවශ්‍ය ගැලපීම් ද සිදු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් සුහසාධක සංගමයට අලෙවි කල ලොතරැයිපත් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.1,567,992 ක් විය. එම ශේෂයන් නිරවුල් කිරීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(උ) මණ්ඩලයෙන් සුහසාධක සංගමයට ලබාගත් රු.2,011,363 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් සංගමය විසින් ආයතනයේ කලාප කළමනාකරුවන් 04 දෙනෙකුට ලබාදී තිබුණි. එම ශේෂයන් නිරවුල් කිරීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වෙනත් ණය ශේෂ තුල වර්ෂ 8 කට වඩා පැරණි රු.1,317,614 ක්වූ ණය ශේෂයක් පැවති අතර ඒ තුළ අක්‍රීය අලෙවි නියෝජිතයන් 71 දෙනෙකුට ගෙවිය යුතු රු.2,637,199 ක් හා ලැබිය යුතු රු.566,146 ක් වූ අතර ඒවා නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(එ) ජලය සහ ඉන්ධන සැපයීම වෙනුවෙන් වර්ෂ 05 කට පෙර ආයතන 02 කට තැන්පත් කර තිබූ රු.202,500 ක තැන්පතුවක්ද 2004 වර්ෂයේදී ඉන්ධන ලබා ගැනීමට ගෙවූ රු.100,000 ක් වටිනා ඇප තැන්පතුවට ද අදාල ආයතන වසා දමා තිබුණද, ඒවා නිරවුල් කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඒ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන හඳුනානොගත් රු. 3,585,823 ක බැර ශේෂයක්ද වර්ෂ 08 කට වැඩි කාලයක සිට ණය හිමියන් 04 දෙනකුට ගෙවිය යුතු රු.15,543,973 ක්ද කාර්ය මණ්ඩලයේ 14 දෙනකුට ගෙවිය යුතු රු.213,112 ක මුදලක්ද වශයෙන් පැවති ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2003 වර්ෂයේදි මියගිය හා වැඩ තහනමට ලක්වූ නිලධාරින් දෙදෙනකුට ගෙවිය යුතු රු.240,983 ක් වූ දිරිදීමනා මුදල්ද, වර්ෂ 08 කට පෙර දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන්ගෙන් පරිගණක වාරික වෙනුවෙන් ලැබී තිබූ රු.256,952 ක මුදල් ද, වැඩිපුර ලද පරිගණක වාරිකද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

(ඕ) ආපසු ගෙවන තැන්පතු ලෙස මණ්ඩලය අයකරගෙන තිබූ රු.7,611,611 ක මුදල 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාලව ලැබී තිබුණි. අදාල සේවාවන් ලබාගෙන තිබුනද එම ආයතන වෙත ඒවා නිරවුල් කර නොතිබූ අතර නියෝජිතයන් විසින් තැන්පතු ලෙස ආයතනයට ගෙවීම් කල රු.107,953 ක මුදල්ද, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.9 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩමේ අයිතිය නිත්‍යානුකූලව සම්පූර්ණයෙන්ම පැවරී නොතිබියදී මණ්ඩලය විසින් එහි නිලධාරියෙකුට රු.624,780 ක නිවාස ණය මුදලක් ලබාදී තිබූ අතර එම නිලධාරියා 2017 ජුනි 17 දින සේවය හැරගොස් තිබුණි. නිවස ඉදිකිරීමට යෝජිත ඉඩම එම ඉඩමේ හිමිකරු විසින් ජීවිත භුක්තිය තබාගෙන නිලධාරියාට පවරා දී තිබුණි. ඉඩමේ හිමිකරු විසින් එම ඉඩමේ භුක්තිය ඉවත් කරගෙන ඉඩමේ අයිතිය නිලධාරියාට පවරනු බවට වූ ලිඛිත ප්‍රකාශයක් පෞද්ගලික නීතිඥ සමාගමක් මාර්ගයෙන් ඉදිරිපත් කර තිබුණි. එහෙත් පසුව අදාළ දේපලේ භුක්තිය නැවත ඉල්ලා එම පාර්ශවය විසින් උසාවියේ නඩුවක් පවරා තිබූ අතර එහි පාර්ශවකරුවෙකු ලෙස මණ්ඩලය නම්කර තිබුණි. මණ්ඩලය තුල වෘත්තීය සුදුසුකම් ලත් නීතිඥයෙකු සිටියදී මෙම නඩුවේ නඩුවාර 12 ක් සඳහා මණ්ඩලය විසින් රු.263,975 ක් නීතිඥ ගාස්තු ලෙස ගෙවා බාහිර නීතිඥයන් යොදවා ගෙන තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී නියෝජිතයන් වෙත බිල්පත් නිකුත්කර විකුණුම් ආදායමට බැර කර තිබූ රු.4,298,410 ක් වටිනා ක්ෂණික ලොතරැයිපත් සමාලෝචිත වර්ෂයේදී ආපසු එවා තිබුණි. එහෙත් 2016 සමස්ත විකුණුම් පදනම් කරගෙන කාර්ය මණ්ඩලයට සහ නියෝජිතයන්ට රු.35,813,250 ක දිරි දීමනා එම වර්ෂයේදී ගෙවා තිබූ අතර එම වටිනාකම් ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2018 මාර්තු 07 දින මහනුවර දිස්ත්‍රික්කයේ පැවති අයහපත් කළහාකාරී තත්ත්වය මත එම දිස්ත්‍රික්කයේ නියෝජිතයින් වෙත දිනුම්වාර 04 ක් වෙනුවෙන් නිකුත්කළ සම්පූර්ණ ලොතරැයිපත් 264,000 ම නොවිකුණු සේ සලකා අදාල දිනුම්වාරවලින් ඉවත් කර තිබුණි. එම නියෝජිතයින් විසින් ඒ වන විට අලෙවිකර තිබූ සියලු ලොතරැයිපත් ද ඇතුලුව සියලුම ටිකට්පත් අවලංගු කිරීමකට ලක්කිරීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවිය.

(ඈ) 2018 සැප්තැම්බර් 28 දින දිනුම් අදින ලද 1896 දිනුම්වාරයේදී නොවිකුණු ලොතරැයිපත් 8,000 ක් 2018 සැප්තැම්බර් 20 දින ජාතික ලොතරැයි මණ්ඩලයේ ගබඩා අංශයට අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිතට භාර දී තිබියදීත් ඒ සඳහා ඉන්වොයිසි නිකුත් නොකිරීම

හේතුවෙන් එම ප්‍රමාණය විකුණුම් ලෙස සලකා කටයුතු කර තිබුණි. එම හේතුවෙන් අලෙවි නියෝජිතයා වෙත නැවත ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් සහ නියමිත රාජකාරි ඉටු නොකිරීමට අදාල නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් 2019 ජුනි 10 වන විටත් සිදුකර නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඉ) 2018 සැප්තැම්බර් 28 දින දිනුම් ඇදිමට නියමිත ධන නිධානය 55 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 900 ක් සහ මෙගා පවර් 285 වන දිනුම්වාරයේ ලොතරැයිපත් 500 ක් අදාල දිස්ත්‍රික් අලෙවි නියෝජිත වෙත ප්‍රවාහනයේ දී අස්ථානගත වීම හේතුවෙන් එම ලොතරැයිපත් සියල්ල අදාල දිනුම් වාරයේ දී නොවිකුණු සේ සලකා ඉවත් කිරීම පමණක් සිදුකර තිබුණි. එහෙත් ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂාවක් සිදුකර අදාල අලාභයන් ගණනය කර ගිණුම් තැබීම සිදුකර නොතිබුණි.

(ඊ) 2000 අගෝස්තු 23 දින සිට සේවය හැර ගොස් ඇති මණ්ඩලයෙන් දේපල ණය ලබාගත් නිලධාරියෙකුගෙන් එදිනට අයවිය යුතු මුදල රු.340,275 ක් වී තිබුණි. එම ණය අයකර ගැනීමට 2019 ජුනි 30 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.10 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 32 වන කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ ලොතරැයියේ දිනුම් ඇදීමේදී අවලංගු කරන ලද රු.627,750 ක් වටිනා අස්ථානගත වූ ලොතරැයිපත් 135 ක් වූ අතර ඒ තුල පුද්ගලික ප්‍රචාරණ ආයතනය මඟින් අස්ථානගත කල ලොතරැයිපත් 66 ක්ද, මණ්ඩලයේ ප්‍රචාරණ අංශයේ කාර්ය මණ්ඩලය මඟින් අස්ථානගත කල ලොතරැයිපත් 69 ක් ද විය. ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා එම මුදල් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2018 වර්ෂය තුලදී මණ්ඩලය සතු අංක 227-0217 දරන ලොරි රථයේ රු.451,605 ක් වැයකර නිර්මාණය කල වෙළෙඳ ප්‍රචාරණ ආකෘතියක් වෙනත් ට්‍රක් රථයක ගැටීමෙන් එම ආකෘතියට හානි වී තිබූ අතර එම අලාභය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී රු.825,000 ක් වැයකොට මිලදීගෙන තිබූ අංක PS-2354 දරන වාහනය 2018 ජුනි 12 දින හදිසි අනතුරකට පත්වීම හේතුවෙන් එම වාහනය ගර්හිත කිරීමට සිදුවන බව රක්ෂකයා මණ්ඩලයට දැනුම් දී ලබාදීමට එකඟ වූ රක්ෂණ හිමිකම් රු.600,000 ක් විය.

(ඇ) ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවයට බඳවාගෙන මුදල් අමාත්‍යාංශයට නිදහස් කර ඇති සම්බන්ධීකරණ නිලධාරියකු වෙත රාජකාරි කටයුතු සඳහා ලබාදී තිබූ KV-0392 දරන වාහනය මණ්ඩලයට නොදන්වා 2018 අප්‍රේල් 12 දින එම නිලධාරියාගේ පෞද්ගලික ගමනක් සඳහා භාවිතා කිරීමේදී අනතුරකට පත් වී තිබුණි. එම වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.538,650 ක පිරිවැයක් දැරීමට සිදුව තිබුණද ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.11 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

මණ්ඩලය විසින් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව අනුරාධපුරය හා මන්නාරම යන දිස්ත්‍රික්ක දෙකෙහි රජයේ බලපත්‍ර ඉඩම් 02 ක සංචාරක බංගලා ඉදිකර පවත්වාගෙන යාම සිදුකරනු ලබයි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

## ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **දළ පිරිවැටුම** | 3 | **20,438,643,440** | **16,747,180,220** |
| **අඩුකළා වක්‍ර බදු** | | | |
| එකතුකළ වටිනාකම් මත බදු | | 890,352,095 | 742,298,500 |
| ජාතිය ගොඩනැගීමේ බදු | | 286,551,044 | 235,767,246 |
| රේගු බදු | | - | 130,831,250 |
| **ශුද්ධ පිරිවැටුම** | | **19,261,740,301** | **15,638,283,224** |
| අඩුකළා: විකුණුම් පිරිවැය | 4 | 16,594,737,754 | 13,567,962,820 |
| **දළ ලාභය** | | **2,667,002,547** | **2,070,320,404** |
| එකතු කළා: වෙනත් ආදායම් | 5 | 414,302,302 | 387,784,659 |
| | | 3,081,304,849 | 2,458,105,063 |
| **අඩුකළා: වියදම්** | | | |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය | 6 | 1,247,541,649 | 1,130,365,798 |
| පරිපාලන වියදම් | 7 | 752,237,186 | 666,740,574 |
| මූල්‍ය පිරිවැය | 8 | 43,391,442 | 36,583,170 |
| **බදු පෙර ලාභ** | | **1,038,134,572** | **624,415,521** |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 9 | 1,174,402,368 | 484,610,312 |
| **වර්ෂය සඳහා ලාභ (පාඩු)** | | **(136,267,795)** | **139,805,208** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි සටහන් අංක 1 සහ 2 යටතේ ගිණුම්කරණ ප්‍රතිපත්ති දක්වා ඇත.

පසුගිය වසරේ රුපියල් මිලියන 624 ක අනුරූප සංඛ්‍යාවට සාපේක්ෂව,2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ බදු පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 1,038 කි. ඒ අනුව බදු පෙර ලාභය 2018 දී 66% කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

කෙසේ වෙතත්, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව ආදායම් බදු අරමුණු සඳහා අනුමත කළ නොහැකි වියදමක් මත (ඒකාබද්ධ අරමුදලට කරන ලද දායකත්වය) අතිරේක ආදායම් බද්දක් පැනවීම හේතුවෙන් බදු ගෙවීමෙන් පසු ලාභය සෘණාත්මක අගයක් බවට පත්විය. ඒ අනුව ලබා දී ඇති තොරතුරු මත,නීතිවලට අවශ්‍ය සංශෝධන සිදුකිරීම ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සිදුකරමින් සිටී.

## විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **වර්ෂය සඳහා ලාභ /(අලාභ)** | **(136,267,795)** | **139,805,208** |
| **පසුකාලීන කාලපරිච්ඡේදයේ දී ලාභය හෝ (අලාභය)ට අනිකුත් විස්තීරණ ආදායම නැවත වර්ග කිරීමෙන් අනතුරුව (ශුද්ධ බද්දට)** | | |
| එකතු කළා: දේපල යන්ත්‍ර උපකරණ විකුණුම් මත ප්‍රත්‍යාගණන ලාභ ගැලපුම් | - | 6,284,766 |
| අඩුකළා : නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණනයේ ප්‍රතිලාභ/අලාභ | (7,278,179) | (11,952,532) |
| එකතු කළා : නැවත ගණනය කළ විශ්‍රමික ප්‍රතිලාභ වෙන්කිරීමට අදාළ විලම්භිත බද්ද | 2,037,890 | (4,781,013) |
| **බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | **(141,508,084)** | **129,356,429** |

# මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ යන්ත්‍ර හා උපකරණ | 10 | 674,931,737 | 706,395,950 |
| ගොඩනැගිලි - ක්‍රියාත්මක තත්ත්වයේ පවතින වැඩ - ප්‍රධාන ගොඩනැගිල්ල | | 26,997,762 | 21,207,245 |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව - ආයෝජන | | 5,336,575 | 5,336,575 |
| ආයෝජන දේපළ | 11 | 29,635,743 | 29,744,787 |
| අස්පෘශ්‍ය වත්කම් | 12 | 2,516,664 | 6,028,797 |
| නිවාස ණය | | 85,152,706 | 78,058,774 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **824,571,187** | **846,772,128** |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 76,838,340 | 97,694,014 |
| වෙළඳ ලැබිය යුතු | 14 | 196,097,920 | 211,108,941 |
| වෙනත් ජංගම වත්කම් | 15 | 793,040,670 | 637,054,485 |
| මුදල් හා මුදලට සමාන දෑ | 16 | 5,006,918,994 | 3,555,067,133 |
| **මුළු ජංගම වත්කම්** | | **6,072,895,924** | **4,500,924,573** |
| **මුළු වත්කම්** | | **6,897,467,111** | **5,347,696,701** |
| | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| රඳවාගත් ඉපැයීම් | 17 | 381,567,349 | 653,427,833 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක | 18 | 2,990,151,520 | 1,879,780,880 |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය** | | **3,371,718,868** | **2,533,208,713** |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත බදු | 19 | 9,444,625 | 40,941,576 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳියාව | 20 | 52,031,249 | 42,867,101 |
| අනෙකුත් ජංගම නොවන වගකීම් | 21 | 4,115,137 | - |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **65,591,011** | **83,808,677** |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 22 | 2,627,898,566 | 2,602,673,211 |
| ගෙවිය යුතු වර්තමාන බදු | 23 | 832,258,665 | 128,006,102 |
| **මුළු ජංගම වගකීම්** | | **3,460,157,231** | **2,730,679,313** |
| | | | |
| **මුළු වගකීම්** | | **3,525,748,242** | **2,814,487,990** |
| | | | |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | **6,897,467,111** | **5,347,696,701** |
| | | | |

මෙම මූල්‍ය ප්‍රකාශන 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ කටයුතු පිළිබඳ හා 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසරේ ලාභය /(පාඩු) පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදේ.

හර්ෂ බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

කේ. ඒ. ආර්. විජේවික්‍රම
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ. අත්සන් කළේ මණ්ඩලය වෙනුවෙන්,

ශ්‍යාමිලා පෙරේරා
සභාපතිනි
කොළඹ
26.03.2019

තුසිත හල්ලොලුව
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2018 රු. | 2017 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| බදු පෙර ලාභ | 1,038,134,572 | 624,415,520 |
| **ගැලපීම්** | | |
| | | |
| ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය | 103,519,648 | 134,921,071 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම | 8,372,159 | 6,190,885 |
| හානිකරන අලාභ | - | 1,355,557 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ/(අලාභ) | 82,494 | (2,078,428) |
| විනිමය ලාභ/(අලාභ)ගැලපුම් | - | 1,522,862 |
| විනිමය ලාභ/(අලාභ) | (13,161,652) | (7,199,256) |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන-රථවාහන | - | (5,795,000) |
| සංචාරක බංගලාවලින් ලැබෙන ආදායම සහ මණ්ඩලීය වාහන වලින් ලැබෙන ආදායම | (1,728,365) | (1,626,703) |
| පොළී ආදායම් | (356,554,698) | (310,402,912) |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | 778,664,159 | 441,303,596 |
| | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| තොග (වැඩිවීම්) / අඩුවීම් | 20,855,673 | (11,589,555) |
| වෙළඳ ලැබිය යුතු (වැඩිවීම්) / අඩුවීම් | 15,011,021 | 312,856,856 |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්) / අඩුවීම් | (116,069,268) | 595,103,798 |
| එ. ව. බදු හා ජා. ගො. බදු ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | (1,571,461) | (47,844,010) |
| ත්‍යාග ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 265,591,377 | (140,567,820) |
| විශේෂ බදු (වියාබද්ධ අරමුදලට )කරන ලද ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | 32,628,303 | (112,893,104) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්) | 277,005,675 | 154,805,226 |
| | 1,272,115,479 | 1,191,174,986 |
| ගෙවන ලද ආදායම් බදු සහ විලම්භිත බදු | (498,037,403) | (1,120,934,690) |
| අනෙකුත් ජංගම නොවන වගකීම් වැඩිවීම් / (අඩුවීම්) | 4,115,137 | - |
| විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සඳහා ගෙවන ලද පිරිවැය | (6,486,190) | (4,546,578) |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **771,707,023** | **65,693,719** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| දේපල, යන්ත්‍ර උපකරණ, ආයෝජන දේපල හා අස්පෘෂ්‍ය වත්කම්වල වැඩිවීම | (74,300,042) | (57,653,175) |
| දේපල, යන්ත්‍ර උපකරණවල විකුණුම් ප්‍රතිලාභ | - | 4,214,400 |
| සංචාරක බංගලාවලින් ලැබෙන ආදායම සහ මණ්ඩලීය වාහන වලින් ලැබෙන ආදායම | 1,728,365 | 1,626,703 |
| සේවක ණය ප්‍රදාන | (53,882,974) | (40,321,047) |
| සේවක ණය ආපසු අය කර ගැනීම් | 40,193,259 | 19,241,212 |
| ලැබුණු පොළී ආදායම් | 323,233,563 | 306,339,468 |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **236,972,171** | **233,447,561** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| ත්‍යාග සංචිතයේ වැඩිවීම් / (අඩුවීම්) | 430,370,642 | 480,416,033 |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **430,370,642** | **480,416,033** |
| වර්ෂය තුළ මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වෙනස්වීම | 1,439,049,836 | 779,557,313 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ (සටහන්) | 3,567,869,159 | 2,775,509,820 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | **5,006,918,994** | **3,555,067,133** |
| **අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්** | | |
| **මුදල් හා මුදලට සමාන දෑ** | **2018** | **2017** |
| කෙටිකාලීන ආයෝජන | 4,384,966,899 | 3,184,206,675 |
| අතැති බැංකු මුදල් | 621,952,095 | 370,860,458 |
| **වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ** | **5,006,918,994** | **3,555,067,133** |
| **සටහන්: වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ** | 3,555,067,133 | 2,768,310,564 |
| එකතු කළා : විනිමය ලාභ/(අලාභ) | 13,161,652 | 7,199,256 |
| අඩුකළා : වර්ෂය තුළ විනිමය ලාභ/(අලාභ)ගැලපුම් | (359,625) | - |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ** | **3,567,869,159** | **2,775,509,820** |

# ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය
## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සම්මුච්ත භාණ්ඩාගාර අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත රු. | භාණ්ඩාගාර ප්‍රදානය මෝටර්රථ | ගොඩනැගිලි සංචිත රු. | ත්‍යාග සංචිත රු. | රඳවාගත් ඉපැයීම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|
| **2017.01.01 දිනට ශේෂය** | **21,263,101** | **327,403,729** | **5,795,000** | **50,000,000** | **946,982,781** | **522,548,543** | **1,873,993,155** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම | - | - | - | - | 480,416,033 | - | 480,416,033 |
| ත්‍යාග සංචිත අරමුදලට ණය පියවීම් | - | - | - | - | 60,000,000 | - | 60,000,000 |
| විනිමය ප්‍රතිලාභ / අලාභය නැවත මාරුකිරීම් | - | - | - | - | - | 1,522,862 | 1,522,862 |
| දේපල යන්ත්‍රහා උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපුම් | - | (6,284,766) | - | - | - | 6,284,766 | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ / අලාභ | - | - | - | - | - | (11,952,532) | (11,952,532) |
| නැවත ගණනය කළ විශ්‍රාමික ප්‍රතිලාභ වෙන් කිරීමට අදාළ විලම්භිත බද්ද (පසු ගිය වසර) | - | - | - | - | - | (4,781,013) | (4,781,013) |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන මාරුකිරීම්- රථ වාහන - නිසාන් සනී N17 | - | - | (5,795,000) | - | - | - | (5,795,000) |
| 2017 වර්ෂය සඳහා ලාභ / (අලාභ) | - | - | - | - | - | 139,805,208 | 139,805,208 |
| **2017.12.31 දිනට ශේෂය** | **21,263,101** | **321,118,963** | **-** | **50,000,000** | **1,487,398,814** | **653,427,834** | **2,533,208,712** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | - | - | - | - | 430,370,642 | - | 430,370,642 |
| රඳවාගත් ඉපැයීම්වලින් ගොඩනැගිලි සංචිතයට මාරු කිරීම | - | - | - | 130,000,000 | - | (130,000,000) | - |
| ගොඩනැගිලි සංචිතයෙන් මහාභාණ්ඩාගාරය කරන ලද දායකත්වය මාරු කිරීම | - | - | - | 550,000,000 | - | - | 550,000,000 |
| විනිමය ප්‍රතිලාභ / අලාභය සඳහා ගැලපුම් | - | - | - | - | - | (359,625) | (359,625) |
| දේපල යන්ත්‍රහා උපකරණ විකුණුම්වල ප්‍රත්‍යාගණන ලාභ සඳහා ගැලපුම් | - | | - | - | - | 7,225 | 7,225 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ / අලාභ | - | - | - | - | - | (7,278,179) | (7,278,179) |
| නැවත ගණනය කළ විශ්‍රාමික ප්‍රතිලාභ වෙන් කිරීමට අදාළ විලම්භිත බද්ද (පසු ගිය වසර) | - | - | - | - | - | 2,037,890 | 2,037,890 |
| 2018 වර්ෂය සඳහා ලාභ / (පාඩු) | - | - | - | - | - | (136,267,795) | (136,267,795) |
| **2018.12.31 දිනට ශේෂය** | **21,263,101** | **321,118,963** | **-** | **730,000,000** | **1,917,769,456** | **381,567,351** | **3,371,718,870** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

සටහන් අංක 01

සංස්ථාමය තොරතුරු

### 1.1. සාමාන්‍ය තොරතුරු

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදි. ඉහත පනතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

මෙය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයකි.ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන පිහිටා ඇත්තේ කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්. ජේ. මුදලිගේ මාවත, අංක 32 දරණ ස්ථානයේ ය.

### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අභිලාශය රජයට ආදායම් උත්පාදනය සඳහා ජාතික ලොතරැයි පැවැත්වීමයි.

### 1.3. මුදල් කාල පරිච්ඡේදය

මණ්ඩලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාලපරිච්ඡේදයකි.

### 1.4. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFR/LKAS) අනුකූලව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. ක්‍රියාකාරී අධ්‍යක්ෂ වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ සටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම දක්වා ඇත.
මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සංරචක අඩංගු වේ.

- විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වර්ෂය අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරයි.
- ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය සමාලෝචිත වර්ෂයෙහි මණ්ඩලයේ අරමුදල්වල වෙනස්වීම විස්තර කරයි.
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා මුදලට සමාන දෑ උත්පාදනය සඳහා මණ්ඩලයට ඇති හැකියාව හා මෙම අරමුදල් උපයෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු සපයයි.
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනිකුත් විස්තරාත්මක තොරතුරු ඇතුළත් වේ.

සටහන් අංක 02

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 2.1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

#### 2.1.1. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම හා සත්‍ය වටිනාකම් පදනම යටතේ උපචිත පදනමට ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 මාර්තු 26 දින අධිකාරී බලය පවරන ලදි.

### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS / SLFRS) සහ 1963 අංක 11 සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවය.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන (SLFRS / LKAS) 2012 අප්‍රේල් 01 වන දා සිට බලාත්මක වන පරිදි වහාම ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මණ්ඩලය පිළියෙල කරනු ලැබූ පළමු මූල්‍ය ප්‍රකාශ වන්නේය. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කොට ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සමග ප්‍රමාණාත්මකව අභිසාරී වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මුල් වරට සම්මත කර ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අදාළ කර ගෙන ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙත සංක්‍රාන්තිය මීට පෙර වාර්තා කරන ලද මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය, මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ වෙත බලපෑමක් ඇති කර ඇති නමුදු එම මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර ඇති පරිදි ඒ සඳහා නිසි පරිදි ගැලපීම් කර ඇත.

### 2.1.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂවරුන් තක්සේරුවක් කර ඇති අතර අස්තිත්වය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට ඔවුන් අපේක්ෂා නොකරයි. පූර්වේක්ෂිත අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාමට සම්පත් තමන් සතු බවට කළමනාකාරිත්වය සෑහීමකට පත් වෙයි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව මත සැලකිය යුතු සැකයන් පහළ කරන්නා වූ කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ කළමනාකාරිත්වය නොදනී. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනමක් මත මූල්‍ය ප්‍රකාශ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

### 2.1.4 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදාගෙන ඇති අතර ඒවා පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තන්හිදී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ නැවත සකස් කර හා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 01 - ' මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම. ප්‍රකාරව පෙර වසරේ ගිණුම්කරණ ප්‍රමිති සමග මණ්ඩලය විසින් මෙම ප්‍රමිති සංගතව ආදේශ කොට ඇත.

### 2.1.5 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

සියලු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට (එතැන් විනිමය අනුපාතය) වාර්තාකරණ ව්‍යවහාර මුදල් ඒකකය මත ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ සහ මූල්‍ය අයිතම වසර අවසාන විනිමය අනුපාතයන්ට ප්‍රති මැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන්, ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් හෝ බැරකම්, වසර අවසාන එතැන් විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන අගයට පරිවර්තනය කරනු ලබන අතර, එයින් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලැබේ.

### 2.1.6 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ පහත දැක්වෙන ද්‍රව්‍යමය අයිතම හැරුණු විට, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය ප්‍රකාරවය.

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා බැරකම්, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ සහ හඳුනා නොගත් ආයු ගණන වැනි එකතුව, අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩුකොට වත්මන් වටිනාකමට හඳුනාගනු ලැබේ.
- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නාවූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

### 2.1.7 ව්‍යවහාර සහ වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතමයන් මනිනු ලබන්නේ මණ්ඩලය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය භාවිතා කරමිනි. (ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල් ඒකකය) මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හා වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හෝ වාර්තාකරණ මුදල් ඒකකයේ වෙනසක් සිදුව නොමැත.

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇති විටෙක හැර, රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නම රුපියලට වටයා ඇත.

### 2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන්ගේ එක් එක් ද්‍රව්‍යමය පංතිය මූල්‍ය ප්‍රකාශනයන්හි සමුච්චිතව ඉදිරිපත් කර තිබේ. 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම් පිළිබඳව වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 මගින් අවසර දී ඇති පරිදි වැදගත් නොවන්නේ නම් පමණක් ස්වභාවයෙන් හෝ කර්තව්‍යයෙන් වෙනස් අයිතම වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇති විට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය ප්‍රකාශ තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කිරීම සිදු කරයි. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත අනාවරණයකදි හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

### 2.1.9. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

**(අ) විනිශ්චයන්**

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑම සහිත, ඇස්තමේන්තු පිළිබඳ විනිශ්චයන් හැරුණු විට, කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර තිබේ.

**(ආ) ඇස්තමේන්තු හා උපකල්පන**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත අනාගතයට අදාල වැදගත් උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර සැලකිල්ලට ලක් කර තිබේ.

## 2.2 වත්කම්

### වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීම් පදනම්

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සියලු කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

### 2.2.1 දේපල, පිරියත සහ උපකරණ

**හඳුනාගැනීමේ පදනම**

අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුලින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විටකදී, දේපල, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනාගනු ලැබේ.

**මැනීමේ පදනම**

**(අ) පිරිවැය**

සියලු දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයටය. වත්කම් අත් කර ගැනීම සඳහා සෘජුව ආරෝපණීය වියදම් පිරිවැයට ඇතුලත් වේ. මණ්ඩලය විසින් ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය සහ හඳුනා ගැනීමේ

නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීන ඉදිකිරීම් සඳහා ප්‍රාග්ධනගත කළ ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. අනෙකුත් සියළු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරනු ලබන අවස්ථාවේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිලිගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසුව එය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනයක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් අදාළ වත්කමේ පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී, ප්‍රතිස්ථාපනය කළ කොටස මණ්ඩලය ඉවත් කර නව කොටස හා ඒ හා ආශ්‍රිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හදුනාගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැය ඇතුලත් කරනු ලැබේ.

**(ආ) ප්‍රත්‍යාගණනය**

වත්කම් මනිනු ලබන්නේ වත්කම මත සමුච්චිත ක්ෂයවීම සහ ප්‍රත්‍යාගණන දිනයෙන් පසු හඳුනාගනු ලබන හානි අලාභ අඩු කොට සාධාරණ වටිනාකමටය. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ගණනය කිරීම් සැලකිය යුතු වාර ගණනකින් සිදු කරනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක්, අනෙකුත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනා ගනු ලැබූ එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුවීමක් එය ප්‍රතිවර්තකරණ ප්‍රමාණයට හැර අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලබන අතර, එවන් අවස්ථාවකදී වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණන හිඟයක්, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කම් මතම පවත්නා අතිරික්තයන් එය හිලව් කරන ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

වත්කමක ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම මත පදනම් ක්ෂයවීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම් ක්ෂයවීම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට වාර්ෂික පැවරුමක් සිදු කරනු ලැබේ. ඊට අතිරේකව, ප්‍රත්‍යාගණන දිනයට සමුච්චිත ක්ෂයවීම වත්කමක දළ ධාරණ වටිනාකමේ ප්‍රමාණයට ඉවත් කරන අතර ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීමේදී, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාල කිසියම් ප්‍රත්‍යාග ණන සංචිතයක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

සියලු දේපල, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තාකරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රත්‍යාගණනය කිරීමේදී, කළ හැකි සෑම විටකදීම එවැනි වත්කම්වල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ වාහන, පරිගණක හා උපාංග, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් තදනන්තරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ රජයේ තක්සේරුකරු වාරිකව සිදුකරන තක්සේරු පාදකව සාධාරණ වටිනාකමට දරනු ලැබේ. 2015 වසරේ දී තක්සේරුව අවසන් කරන ලදි. මීළඟ ප්‍රත්‍යාගණනය 2020 වර්ෂයේ දී සිදුකරනු ලැබේ.

**(ඇ) ක්ෂයවීම**

ක්ෂයවීම පදනම්ව ඇත්තේ වත්කමක පිරිවැයෙන් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙනි. එක් එක් වත්කම්වල සැලකිය යුතු සංරචක තක්සේරු කරනු ලබන අතර යම් සංරචකයකට එම වත්කමේ ඉතිරි ඒවායින් වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් තිබේ නම්, එම සංරචකය වෙනම ක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එසේ කරනුයේ එම වටිනාකම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ලියා හැරීමටය.

කල්බදු වාරය අවසානයේදී මණ්ඩලය විසින් හිමිකාරිත්වය ලබාගන්නා බවට සාධාරණ ලෙස නිශ්චිත වන්නේ නම් මිස මූල්‍ය කල්බදු යටතේ දරනු ලබන වත්කම් කල්බදු වාරයේ වඩා කෙටි වාරය සහ ඒවායේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිටවන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත කරන දිනය යන

දිනවලින් කලින් පැමිණෙන දිනයේය. වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයුකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය නම් පමණක් වෙනස් කරනු ලැබේ.

පෙර වසරවල අනුපාත හා සංගත මෙම කාර්යය සඳහා යොදා ගනු ලැබූ මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

| | වාර්ෂිකව % |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 5 |
| දිනුම්ඇදීම සඳහා ගන්නා බැරල, ලොතරැයි උපකරණ | 20 |
| මෝටර් රථ | 25 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ | 20 |
| ප්‍රවර්ධන උපකරණ | 33.3 |

**(ඈ) පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය තුලට ලැබීමේ භව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණි. පහත දී ඇති ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටස්වල ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය ඒවා දරනු ලබන විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිලිගනු ලැබේ.

**(ඉ) ඉවත් කිරීම**

මුලින් හඳුනාගත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් සහ ඒවායේ යම් වැදගත් කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදී ඉවත් කරනු ලැබේ. විකිණීමේදී හෝ වත්කම ඉවත් කිරීම මත මතුවන කිසියම් ප්‍රතිලාභයක් හෝ අලාභයන් (බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ වත්කම් ධාරණ වටිනාකම අතර වෙනස) වත්කම ඉවත් කරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාල, ක්ෂය කිරීමේ ක්‍රම වේද සමාලෝචනය කරනු ලබන අතර, යෝග්‍ය නම් ප්‍රතිපත්ති, සම්පාදකයන් සඳහා මූල්‍ය ප්‍රකාශවල සපයා ඇති තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම පිණිස ඉදිරිකාලීනව ගලපනු ලැබේ.

**(ඊ) පුනස්ථාපන පිරිවැය**

ආරම්භයේදී තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ නඩත්තු කිරීම පිණිස දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා හෝ නඩත්තුව සඳහා දරන ලද වියදම්, දරනු ලැබූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

### 2.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ, වත්කම පළමු උපයෝජන අවස්ථාවේදී අදාල වත්කම් ගිණුමට පවරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන පිරිවැය යනු මිලදීගැනිමේ හෝ ඉදිකිරීමේ හා ඊ ආශ්‍රිත වෙනත් ඕනෑම වියදමක් සහිත පිරිවැය වේ.

ස්ථිර ස්වභාවයේ නොනිමි ප්‍රාග්ධන වැඩ මත හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය ඉහළ නැංවීම පිණිස දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් සේ සලකා තිබේ.

නොනිමි ප්‍රාග්ධන වැඩ පළමු උපයෝජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රිය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

## 2.2.3 අස්පෘශ්‍ය වත්කම්

### පරිගණක මෘදුකාංග

වෙන් වෙන්ව අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩු කර පිරිවැයට ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යනු කුලිය සඳහා හෝ පරිපාලන කාර්යය සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා දරනු ලැබූ භෞතික ද්‍රව්‍යය නොමැති හදුනාගත හැකි මූල්‍ය නොවන  වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ආයු කාලය පරිමිත හෝ අපරිමිත සේ තක්සේරු කරනු ලැබේ.පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී ඇත්තේ යැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත් පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් වාර්ෂිකව 25% අනුපාතයට ක්‍රම ක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේ හෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවේ වෙනස්කම් උචිත පරිදි, ක්‍රමක්ෂ කාලසීමාව හෝ ක්‍රම වේදය වෙනස් කිරීම මගින් ගිණුම්කරන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සලකනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - 'අස්පෘශ්‍ය වත්කම් ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිලිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

## 2.2.4 කල්බදු වත්කම්

කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ ආරම්භයේදී සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ  අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දේට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාලසීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය, කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව  හෝ වැඩි දියුණු කිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ යන දෙකින් වඩා  කෙටිකාලයක පුරා ප්‍රාග්ධනගත කිරීම සහ ක්ෂය කිරීම කරනු ලැබේ.

වත්කම් විකිණීමට සහ බදු ගැනීමේ ගනුදෙනුවකට අදාලව පවතින වටිනාකමට සාලපේක්ෂව විකුනුම් වටිනාකමේ අතිරික්තයක් වේ නම් එම ප්‍රමාණය විලම්බිත කර බදු කාලසීමාව තුලදී ක්‍රමක්ෂය කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ  බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ වටිනාකම මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්බිත කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.2.5 ආයෝජන දේපල

### (අ) හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා එනමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලදී විකිණීම, භාණ්ඩ හෝ සේවා නිපදවීමේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා හෝ පරිපාලනමය කාර්යය සඳහා නොවන දේපල  වේ.

### (ආ) මැනීමේ පදනම

අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සහ ආයෝජන දේපලේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ හවයතාවක් තිබේ නම් පමණක්ම ආයෝජන දේපල හඳුනාගනු ලැබේ. නිදහස් අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලිවලින් සමන්විත, ආයෝජන දේපල යනු දිගුකාලීන කුලී සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකම සඳහා රඳවාගනු ලබන දේපල වන අතර භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා හෝ පරිපාලනය සඳහා සාරානුකූලව යොදාගනු නොලබන අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට අදහස් කරනු නොලබයි.

ආයෝජන දේපල ආරම්භයේදී සහ පසුකාලීනව ආශ්‍රිත ගනුදෙනු පිරිවැය ඇතුළුව, පිරිවැයට මනිනු ලබන අතර එබැවින් සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකොට පවත්වා යනු ලැබේ.

වෙළඳපොල වටිනාකම විවෘත කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන දේපල වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකමේ වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### (ඇ) ඉවත් කිරීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන නිසාවෙන් බැහැර කළ විටදී හෝ භාවිතයෙන් ස්ථිරවම අයින් කළ විටදී ආයෝජන දේපල ඉවත් කරනු ලැබේ.

### (ඈ) ආයෝජන දේපලවලට / දේපලවලින් පසුකාලීන පැවරුම්

අයිතිකරුගේ අධිවාසය අවසන්වීම, වෙනත් පාර්ශ්වයකට මෙහෙයුම් බදු දීමක් ආරම්භ කිරීම හෝ විකිණීමේ අරමුණ ඇතිව ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කිරීම මගින් තහවුරු වන, භාවිතයේ වෙනසක් සිදුවූ විට පමණක්ම ආයෝජන දේපලවලට පැවරුම් සිදු කරනු ලැබේ.

## 2.2.6 මූල්‍ය නොවන වත්කම් හානිය

සෑම වාර්තාකරණ දිනයකටම වත්කමක් හානි වී ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයි. එවැනි හානිකරණ ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට බැංකු වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විකිණීමේදී දරන පිරිවැය අඩු කළ වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගය සහ භාවිතා කිරීමේ වටිනාකමට වඩා වත්කමක ආපසු අය කර ගත හැකි අගය ඉහළ වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් ජනන ඒකකය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්මනෙහි විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. මිලැයුම් ගුණාකාර, ප්‍රකාශිත කොටස් මිල, හෝ පවතින අනෙකුත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය ස්කන්ධ කරා රැගෙන යනු ලැබූ පූර්වයෙන් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම් හැරුණු විට, හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල අඛණ්ඩ මෙහෙයුම්වල හානි අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එවන් අවස්ථාවකදී, පූර්වයෙන් සිදුකරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක වටිනාකම දක්වා හානිය ස්කන්ධයේ හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර, වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් හානිකරණ අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. එවැනි නිරීක්ෂණයක් ඇත්නම්, මණ්ඩලය විසින් වත්කමේ ආපසු අය කරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනුයේ, අවසන් වරට හානිකරණ අලාභ හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වෙනස් වේ නම් පමණි. එය එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කරගත හැකි වටිනාකමට ඉහළ නංවනු ලැබේ.

පෙර වසරවලදී වත්කම සඳහා හානි අලාභයක් හඳුනාගෙන නොමැති නම්, එම වැඩිකල වටිනාකමට ක්ෂයවීම නොමැතිව නිශ්චය කිරීමට ඉඩ තිබූ ධාරණ වටිනාකම ඉක්මවා යාමට නොහැක. වත්කමෙ ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වා නොගන්නේ නම් මිස, එබඳු ප්‍රතිවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර එබඳු අවස්ථාවකදී ප්‍රතිවර්තනය, ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

## 2.2.7 විකිණීම සඳහා රඳවා ගත් ජංගම නොවන වත්කම්

විකිණීම සඳහා ඇති වත්කම්වල ධාරණ වටිනාකම මූලිකවම විකුණුම් ගනුදෙනුවක් හරහා අය කර ගැනීමට නියමිත විටදී හා විකුණුම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවක් ඇතැයි සලකනු ලබන විටදී ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකොට ධාරණ වටිනාකම සහ සාධාරණ අගය යන දෙකින් වඩා අඩු දෙයට එය සඳහන් කරනු ලැබේ.

ජංගම නොවන වත්කම් සහ බැහැර කරන කාණ්ඩ විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ විකිණීම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවයක් ඇති විටදී සහ  වත්කම හෝ බැහැර කරන කාණ්ඩය එහි වත්මන් තත්ත්වයෙන් වහාම විකිණීම සඳහා පවතින විටදී පමණි.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීමෙන් පසුව ක්ෂය කිරීම හෝ ක්‍රමක්ෂණ කිරීම කරනු නොලැබේ.

## 2.2.8 මූල්‍ය වත්කම්

වත්කම අත්පත් කරගත් කාර්යය මත පරායත්ත වූ මණ්ඩලය සිය මූල්‍ය වත්කම් පහත සාකච්ඡා කර ඇති කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ. එක් එක් කාණ්ඩ සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිපත්ති පහත පරිදි වේ.

### (අ). ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ  සක්‍රිය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සැපයීම හරහා ඒවා මූලිකවම මතුවන නමුත් (උදා : වෙළඳ ලැබිය යුතු දෑ) අනෙකුත් ආකාරයේ ගිවිසුමකර මූල්‍ය වත්කම් ද එයට අන්තර්ගත වේ. සාධාරණ වටිනාකමට සහ ඒවා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට ඒවා පළමුව හඳුනාගනු ලැබේ. කාර්ය මණ්ඩලය සේවයේ නියුක්තව සිටින බැවින් සහ වෙළෙන්දන් කාර්යසාධන බැඳුම්කරයක් ලබා දී ඇති බැවින් ආපසු අය කරගැනීම නිශ්චිත නිසාවෙන් ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය නොකළ අතර සාධාරණ වටිනාකමට පෙන්නුම් කෙරේ.

- නිවාස ණය - අවුරුදු 07ක මූලික වැටුප (උපරිමය රු. 2,500,000/= දක්වා ).පොළී අනුපාතය 4% වයස අවුරුදු 55 දක්වා අය කර ගැනීම.
- ආපදා ණය - මාස 10 මූලික වැටුප (උපරිමය රු. 250,000/= දක්වා ). පොළී අනුපාතය 4.2% මාසික වාරික 60 කින් අය කර ගැනීම.
- 2016.09.12 දින වන විට රු. මිලියන 600ක් ව තිබූ ගොඩනැගිලි අරමුදලින් රු. මිලියන 550ක මුදලක් නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය වූ විට නැවත ගෙවීමට මහා භාණ්ඩාගාරය අතර එකඟතාවය මත 2016.12.02 දින රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදි.

### (ආ).වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම් පිරිවැයටය.

### ඇ). බොල් ණය සඳහා ප්‍රතිපාදන

එක් එක් ණයගැති ශේෂයන් වෙනුවෙන් ලබාගත් බැංකු ඇපකර ඉවත් කළ පසු ඉතිරිවන අනාරක්ෂිත වෙළඳ ණයගැතියන්ගේ ශේෂයන් 5%ක් සඳහා එනම් රු. 3,381,765.96 වටිනාකමක් සඳහා 2018.12.31 දිනට බොල් ණය ප්‍රතිපාදන වෙන් කරන ලදි.

## 2.2.9 තොග

නිෂ්පාදනයේ කෙටි ජීවන චක්‍රය හේතු කොටගෙන ශුද්ධ උපලබ්ධි අගයක් නොමැතිවීම නිසා යල්පිනු සහ සෙමින් විකිණෙන  අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, වට්ටෝරු භාණ්ඩ පිරිවැයට පමණක් මනිනු ලැබේ.  ලොතරැයිපත් වේගයෙන් අලෙවි වන බැවින් ශුද්ධ උපලබ්ධි අගය හඳුනාග ැනීමේ අවශ්‍යතාවයක් නොමැත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය  ව්‍යාපාර කටයුතුවලදී  සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට වට්ටෝරු භාණ්ඩ විකිණිය හැකි මිලය.

රන් භාණ්ඩ, මෝටර් රථ සහ අනෙකුත් ත්‍යාග ඇතුළත් ත්‍යාග තොග, ඒවාට විකුණුම් වටිනාකමක්

නොමැති බැවින් සහ දරන ලද වියදම පමණක් ඇති බැවින් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. එවැනි සියලු තොග අනාගතයේ ඕනෑම වේලාවක ත්‍යාග ලෙස පිරිනමනු ලබන මුත් 'අතේ දුරින් ගනුදෙනුවක් මගින් විකුණනු නොලැබේ.

වට්ටෝරු භාණ්ඩ ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය වට්ටෝරු භාණ්ඩ පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

### 2.2.10 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු ලෙස නිර්වචනය කෙරේ. අතැති මුදල්, ඉල්ලූ විට ලබාගැනීම සඳහා බැංකුවේ රඳවා ඇති තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඊට ඇතුලත් වේ.

වක්‍ර ක්‍රමය මත පාදකව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

## 2.3 ස්කන්ධ ප්‍රාග්ධනය, වගකීම් හා ප්‍රතිපාදන

### 2.3.1 ස්කන්ධ ප්‍රාග්ධනය

**සම්මුචිත භාණ්ඩාගාර අරමුදල**

මෙය මහා භාණ්ඩාගාරය විසින් හඳුන්වා දුන් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය කරයි.

**ප්‍රත්‍යාගණනය කළ සංචිතය**

2015 වර්ෂයේ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සිදු කරන ලද දේපල, යන්ත්‍ර හා උපකරණ නැවත ප්‍රත්‍යාගණනයේ ශුද්ධ ප්‍රත්‍යාගණිත ලාභය ප්‍රත්‍යාගණන සංචිත තුළින් නියෝජනය කරයි.

**ගොඩනැගිලි සංචිත අරමුදල**

යෝජිත ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම් අවශ්‍යතාවය සඳහා අවශ්‍ය අරමුදල් උත්පාදනය කිරීමේ හා ප්‍රයෝජනයට ගැනීම සඳහා ගොඩනැගිලි සංචිත අරමුදල පිහිටුවා ඇත. ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන විට ආපසු ලබාගත හැකි පදනම මත රු. මිලියන 550 ක් මහා භාණ්ඩාගාරයට ගෙවනු ලැබීය.

**ත්‍යාග සංචිත අරමුදල**

ලොතරැයිවල සුපිරි ත්‍යාග සහ විශේෂ දිනුම්වාරවල ත්‍යාග පිරිනැමීම සඳහා මණ්ඩලය විසින් ත්‍යාග සංචිත අරමුදල පවත්වාගෙන යනු ලබයි.

**රඳවාගත් ඉපැයීම්**

මෙයින් මෙහෙයුම්වල බදු පසු සමුච්චිත ශුද්ධ අතිරික්තය නියෝජනය කරයි.

### 2.3.2 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන බැරකම් වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී දන්නා සියලුම බැරකම් ගිණුම්ගත කොට ඇත. 2014 වසරේ ත්‍යාග සංචිත අරමුදලින් රු. මිලියන 325ක් පොළී රහිත ණය පදනම මත ලබාගත් අතර 2015 වසරේදී එයින් රු. මිලියන 205ක් නැවත පියවන ලදි. ගෙවිය යුතු ඉතිරි මුදල වන රු. මිලියන 120ක් 2017.12.31 දින වන විට සම්පූර්ණයෙන්ම පියවා ඇත.

වෙළඳ ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පොත් වටිනාකමට සඳහන් කර ඇත.

### 2.3.3 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) මණ්ඩලය සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

සම්පත් ගලායාම අසම්භාවය නොකළහොත් මිස, සියලු අසම්භාව්‍ය බැරකම් සටහන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ.

**සේවයේ යළි පිහිටුවීම හෝ වන්දි ගෙවීම**

කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩු පැවරූ හිටපු සේවකයෙකුට වන්දි ලෙස රු.3,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

**අපහාස කිරීම**

කොළඹ දිසා අධිකරණයේ මණ්ඩලයට එරෙහිව අපහාස නඩුවක් පැවරූ පුද්ගලයෙකුට රු. 50,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

**ණය අයකර ගැනීම්**

පුද්ගලයන් තිදෙනකු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩු සඳහා මණ්ඩලයට රු9,114,210 සහ 15,067,307.50 මුදලක් ණය අයකර ගැනීම් වශයෙන් ගෙවීමට සිදුවිය හැක.

## 2.3.4 බදුකරණය

**ජංගම බදු**

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2017අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කර ඇත.

**විලම්බිත බදුකරණය**

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගනු ලැබේ. සියලු අඩුකළ හැම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන ගිය ප්‍රයෝජනයට නොගත් බදු බැර සහ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ සඳහා බදු අයකළ හැකි ලාභය පැවතීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම එක් එක් ශේෂපත්‍ර දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්බිත බදු සියල්ල හෝඉන් කොටසක් ප්‍රයෝජනයට ගනු ලැබීමට ඉඩදීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් පැවතීමට තවදුරටත් භව්‍යතාවයක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එක් එක් දිනට ප්‍රති තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට හැකි වන ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් මනිනු ලබන්නේ පනවනු ලැබ ඇති හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් දිනට සාරානුකූලව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි කළ හෝ බැරකම පියවනු ලැබූ අවස්ථාවේ එම වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ටය.

## 2.4 සේවක ප්‍රතිලාභ

### 2.4.1. කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

**මණ්ඩලය විසින් පහත සඳහන් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සපයනු ලැබේ.**

i. වැටුප්

ii. මාසික හා වාර්ෂික දිරි දීමනා /ලොතරැයි විකුණුම් ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස තීරනය කරනු ලබන මාසික හා වාර්ෂික දිරි දීමනා.

iii. ප්‍රවාහන දීමනා

iv. වාර්ෂික ප්‍රසාද දීමනා

v. වෛද්‍ය බිල්පත්

vi. නිල ඇඳුම් දීමනාව

vii. නිවාඩු දින ආහාර

viii. මූල්‍යමය නොවන ප්‍රතිලාභ, වෛද්‍ය පහසුකම් වැනි දෑ

ix. ලොතරැයි දිනුම් ඇදීම වෙනුවෙන් සහභාගී වන්නන් සඳහා දිනුම් ඇදීමේ දීමනාව

x. නිලධාරීන් හා එයින් පහළ ශ්‍රේණි අය සඳහා නිවාඩු දින අතිකාල දීමනා සහ නිවාඩු දින රාජකාරි කිරීම වෙනුවෙන් ඉහළ ශ්‍රේණි සඳහා රාජකාරි දීමනා

xi. සේවක සුභසාධක හා සකසුරුවම් ව්‍යවස්ථාවට අනුව දෙනු ලබන වරප්‍රසාද.

## 2.4.2 සේවය අවසන් කළ පසු ගෙවන ප්‍රතිලාභ - විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**(අ) නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ. සේ.අ.අ සඳහා සේවකයන්ගේ දායකත්වය 10% වන අතර මණ්ඩලය විසින් 15%.සපයයි. සේ.භා.අ. සඳහා මණ්ඩලය විසින් 3% සපයයි.

**(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය**

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධානවලට අනුව මණ්ඩලය සමඟ අඛණ්ඩ ව අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් නිර්දේශ කර ඇති පරිදි අංක 19 දරණ සේවක ප්‍රතිලාභ සඳහා ආයුගණක ප්‍රක්ෂේපිත ණයවර ක්‍රමවේදය (PUC) යටතේ මණ්ඩලයේ සෙවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන කර ඇත. 2018.12.31 දිනට මෙම ආයුගණක තක්සේරුව වෘත්තීයමය සුදුසුකම් ලත් ආයුගණක ආයතනයක් වන Actuaries Messer's Actuarial and Management Consultant (Pvt) Ltd. මගින් සිදුකර ඇත. ආයුගණක තක්සේරුව සෑම වසරක ම ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බලාපොරොත්තු වේ. ආයුගණක විසින් භාවිතා කළ මූලික උපකල්පනයන් පහත පරිදි වේ.

| | | 2018 |
|---|---|---|
| ආයුගණක තක්සේරු ක්‍රමය | - | ආයුගණක ප්‍රක්ෂේපිත ණයවර ක්‍රමය (PUC) |
| වට්ටම් ප්‍රතිශතය | - | 2018 - 11% |
| | - | 2017- 10% |
| අනාගත වැටුප් වර්ධකය | - | සේවයට බැඳුණු දින සිට වර්ෂයකට 5%ක වැටුප් වර්ධකය හා ඉන් පසු වාර්ෂිකව. |
| | - | පෙර වර්ශයේ වැටුප් වර්ධක අනුපතය 1% කි. |
| අනාගත දීමනා වර්ධකය | - | 2019.01.01 දිනට 10% වර්ධකයක් |
| කාර්යය මණ්ඩල පිරිවැටුම් අනුපාතය | - | වයස අවුරු. 54 දක්වා 4% ද ඉන්පසු ශූන්‍යවේ |
| විශ්‍රාමික වයස | - | අවුරුදු 60 |
| අක්‍රිය අනුපාතය | - | මරණ සංඛ්‍යා වගුවෙන් 10%. |
| මරණ සංඛ්‍යා වගුව | - | ඒ 1967/70 මරණ සංඛ්‍යා වගුව |

2011 වසරේදී එක් මාසයක වැටුප පදනම්ව ප්‍රක්ෂේපිත ඒකක ණයවර ක්‍රමවේදය යටතේ ගිණුම්ගත කර පාරිතෝෂිකය ලබාදුන් අතර එම මුදල රු. 3,620,091 ක් විය. කෙසේ වෙතත්, 2012 අගෝස්තු සිට මෙය සේවයේ සම්පූර්ණ කරන ලද එක් එක් වසර සඳහා අර්ධ මාසික වැටුප ලෙස ප්‍රතිවර්තනය කරන ලදී.

(ඇ) සේවයෙන් විශාමයෑමේදි වසර 25 ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා සේවය ඇගයිමක් වශයෙන් රු 25,000 ක මූල්‍ය ප්‍රතිලාභයක් හිමි වේ.

## 2.5 ආදායම් ප්‍රකාශනය

### 2.5.1 ආදායම හඳුනාගැනීම

**(අ) භාණ්ඩ විකිණීම**

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත

පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. හිමිකාරීත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති විටදී, ප්‍රතිෂ්ඨාව නැවත අය කර ගැනීම විය හැකි විටදී සහ භාණ්ඩ ආශ්‍රිත පිරිවැය සහ ඇතිවිය හැකි ලාභ විශ්වාසනීය ලෙස මැනිය හැකි විටදී ආදායම හඳුනාගනු ලැබේ.

**(ආ) පොළිය**

කාල පදනමක් මත උපචිත වන සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත්**

අනෙකුත් ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

### 2.5.2 වියදම හඳුනාගැනීම

(අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම්වල ඉපැයුම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදුවූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

### 2.5.3. විශේෂ බදු සඳහා ගෙවීම් (ඒකාබද්ධ අරමුදලට ගෙවීම් )

1971 අංක 38 දරණ මුදල් පනතේ (9)(2)(ඊ) පරිච්ඡේදය අනුව විශේෂ බදු සඳහා ගෙවීම් (ඒකාබද්ධ අරමුදලට) කරන ගෙවීම් හෝ රජයට කරන ගෙවීම් මුදල් අමාත්‍යවරයා විසින් වරින් වර තීරණය කරනු ලබන ප්‍රමාණය අනුව මණ්ඩලයේ ශුද්ධ ආදායම ගණනය කිරීමේදී ආදායමට එරෙහිව ගලපන ලදි. ඒ අනුව පසුගිය වසරේ විශේෂ බදු සඳහා ගෙවීම් (ඒකාබද්ධ අරමුදලට) ගෙවන ලද රු. 2,016,986,556 සමඟ සසඳන විට අදාළ වසර තුළ රු. 2,426,955,888 ක් ගෙවන ලදි.

**රේගු බදු පැනවීම**

1989 අංක 13 දරණ රේගු බදු සඳහා වූ රේගු පනතේ (විශේෂ ප්‍රතිපාදන) 3 වන වගන්තිය යටතේ ලොතරැයි පනතින් 15% හෝ රු. 5 ක් යන දෙකින් වැඩි අගය රේගු බද්දක් ලෙස 2017.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවන ලදි.මුදල් අමාත්‍යාංශයේ නියමය පරිදි රේගු බද්දක් ගෙවීම සඳහා මණ්ඩලය විසින් ලොතරැයි පතක මිල රු. 20 සිට රු. 30 දක්වා වැඩි කරන ලදි. 2017 ජනවාරි මාසයේ අලෙවි පිරිවැටුම දැඩි ලෙස පහත වැටුණ බැවින් 2017.02.01 දින සිට බල පැවැත්වෙන පරිදි මිල වැඩි වීම නැවත පැවති මිලට ම එනම් රු. 20 දක්වා පහත හෙලන ලදි.

## 2.6 අවදානම් කළමනාකරණය

අනෙකුත් සියලු ව්‍යාපාරයන්ට පොදු පරිදි, මණ්ඩලය අවදානම්වලට නිරාවරණය වී තිබේ. එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලයේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සහ ඒවා මැනීම සඳහා යොදාගත් ක්‍රමවේද මෙම සටහන විස්තර කරයි. මෙම අවදානම් පිලිබඳ තවත් ප්‍රමාණාත්මක තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශ පුරාම ඉදිරිපත් කර තිබේ. තම මෙහෙයුම් හරහා මණ්ඩලය පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

**(අ) දේශපාලන අවදානම**

දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් මණ්ඩලයේ කටයුතුවලට බලපෑම් ඇති කරයි. කෙසේ වෙතත් එවැනි අවදානම් අවම කිරීම පිණිස කළමනාකාරීත්වය සහ පද්ධති මැනවින් ස්ථානගත කර ඇත.

**(ආ) නෛතික අවදානම**

නෛතික අවදානම අදාල වනුයේ නව ලොතරැයි ක්‍රියාත්මක කිරීමේදී රට තුළ ඒවායේ අලෙවිය සීමා කරන රෙගුලාසි සම්බන්ධයෙනි.

**(ඇ) කීර්තිනාම අවදානම**

